# වාර්ෂික වාර්තාව 2014

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ගොඩනැගිලි අංක 05, 01 වන මහල, බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.
දුරකථන: +94(0)11-2677445 ෆැක්ස්: +94(0)11-2682534
Email: info@energy.gov.lk  Web: www.energy.gov.lk

# සභාපතිතුමාගේ පණිවුඩය - 2014



අප වෙත දායාද වී ඇති ශිෂ්ඨාචාරය, විවිධ වෙනස්වීම් වලට භාජනය වී නොයෙකුත් යුග පසු කරමින් පැමිණි දිඟු ගමනක කූටප්‍රාප්තියකි. මෙම වර්තමාන ශිෂ්ඨාචාරය පොසිල ඉන්ධන මත බෙහෙවින් රඳා පවතින එකක් බව අප වටහා ගත යුතුයි. එළැඹී ඇති මේ සියවස තුළ ලෝක ජනගහනනය කෝටි 800 පසුකොට යාමට නියමිතව ඇත. මෙයින් කෝටි 200 කට ආසන්න ජනතාවක් තවමත් මෙකී බලශක්ති පාදක ශිෂ්ඨාචාරය විසින් ගිලගෙන නැති වුවත් ඔවුන්ට අනෙකුත් ජනතාවට මෙන් තම ජීවන රටාව පහසුකර ගැනීම උදෙසා අවශ්‍යාවන ශක්ති සේවාවන් ලැබී නොමැත.

ඒ අනුව අද දවසේ මානව වර්ගයා විසින් මුහුණ දී ඇති ප්‍රධානතම තර්ජනය කුමක් දැයි විමසුවහොත් ලැබෙන පිළිතුරු රැසකි. වර්ගවාදී, ආගම්වාදී යුද්ධ සහ බලශක්තිය හා අනෙකුත් සම්පත් අරබයා හටගෙන ඇති අර්බුද මෙහිදී කැපී පෙනෙනු ඇත. කෙසේ වුවත් සෘජුව නොපෙනෙන අනිවාර්යයෙන්ම අප වෙත එල්ල විය හැකි මහා තර්ජනය නම් මානව වර්ගයා මිහිතලයෙන් වඳවී යාමේ තර්ජනයයි. අප වර්ගයා විසින් මිහිතලය වෙත ඇතිකොට ඇති බලපෑම් කෙතරම් තීව්‍ර දැයි වටහා ගන්නා විටම ලෝක ජනගහනය කෝටි 700 පසුකොට තිබිණ.

මෙසා විශාල ජනගහනයක් සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණයන් මිහිමත තිබේ දැයි දැන් පැනයක් හටගෙන ඇත. මෙවන් විශාල පරිමාණයකින් අප ලෝකයේ සම්පත් නිස්සාරණය කිරීමක් ඉතිහාසයේ සිදුවී නොමැති තරමය. විශේෂයෙන්ම පොළව කැන මතුකර ගන්නා ඛණිජ තෙල්, ගල් අඟුරු හා ස්වභාවික වායු, බලශක්ති සම්පාදනයේ යෙදවීම නිසා හටගෙන ඇති සුවිශේෂී අර්බුදය නම් ගෝලීය උණුස්ම් වීමේ අර්බුදයයි. ඒ තුළ මානවයාට අහිතකර බපෑම් ඇතිකරන මැසි, මදුරු, කැරපොත්තන් වැනි කෘමීන් පරිසරය තුළ වැඩිවන අතර දැරිය නොහැකි උණුසුම් තත්වයක් හමුවේ මානවයා වඳවී යාම ඇරඹෙනු ඇත.

මෙම පසුබිම තුළ සීඝ්‍රයෙන් ක්ෂයවී යන ඛණිජ ඉන්ධන සහ එලෙසම සීඝ්‍රයෙන් වර්ධනය වන එම ඉන්ධන සඳහා වන ඉල්ලුම සහ ඛණිජ ඉන්ධන දහනය හරහා ඇතිවී තිබෙන පාරිසරික බලපෑම් හේතුවෙන් ගොඩනැගී ඇත්තේ නොවිසඳිය හැකි ගැටළුවකි. මේ සඳහා විසඳුම් සෙවිය යුත්තේ පවත්නා රාමුවෙන් පිටත සිදුවන්නාවූ පරිකල්පනයන් තුළ බව මාගේ විශ්වාසයයි.

මේ සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සීඝ්‍ර ලෙස වර්ධන කිරීමත්, බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාවය සීඝ්‍ර ලෙස වැඩි කිරීමත් ශ්‍රී ලංකාව වැනි රටකට බහුලව යොමු විය හැකි ප්‍රවේශයන් දෙදකි. එසේ වුවද මෙම විසඳුම සඳහා ප්‍රබලව දායකත්වයක් ලබා දිය හැකි තුන්වෙනි ප්‍රවේශය බොහෝ විට අප අවධානයෙන් ගිලිහී ඇති බව කිව යුතුමය. මෙම ප්‍රවේශය වන්නේ අප වර්ගයාගේ අධි පාරිභෝජන ජීවන රටාව, වඩාත් මිහිතලය වෙත සෞම්‍ය වන පරිදි වෙනස් කිරීමයි. මෙහිදී තිරසාර බලශක්ති පිළිබඳ වූ දැනුම්බර සමාජයක් ස්ථාපිත කිරීම ප්‍රමුඛ කාර්යයකි. එහිදී බලශක්තියක් ලෙස පොසිල ඉන්ධන භාවිත කිරීම තුළ සිදුවන පරිසර හානියත්, බලශක්ති සංරක්ෂණයේ ඇති වැදගත් කමත් පිළිබඳව අනාගත පරපුර දැනුවත් කිරීමේ කාර්යයද අප මේවන විටත් ආරම්භ කර ඇත.

පවත්නා ඛේධනීය කටුක සත්‍යයට මුහුණ දෙනු වස් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යන ගමන්මග තුළ බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීම උදෙසා පෙළගැසී සිටින කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ

ජනරාල් තුමා සහ ආයතනික කාර්යමණ්ඩලය
ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

**සභාපති**
ප්‍රසාද් ගල්හේන
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

# අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය - 2014



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රීලසුබඅ) වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවුඩය මා ගෙන එන්නේ සතුටිනි. 2014 වර්ෂයේදී අධිකාරියෙහි ප්‍රධාන සාක්ෂාත් කර ගැනීම් නැවත සිහිගැන්වීම සඳහා මම මෙය විශේෂ අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රීලසුබඅ වර්ෂ 2007 ඔක්තෝබර් මස සිදු වූ එහි ආරම්භයේ සිටම විශිෂ්ට තිරසාර ක්‍රියාකාරකම් තුළින් බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සාක්ෂාත් කර ගැනීම කරා ජාතිය මෙහෙයවමින් සිටී. කැප වූ කණ්ඩායමක නොනවතින ප්‍රයත්නයන් තුළින් පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණ ක්ෂේත්‍රවල සැළකිය යුතු සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අප සමත් වී ඇත. කුඩා-ජල විදුලි, සුළං සහ ජෛවස්කන්ධ බලාගාර වැනි නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර හඳුනා ගැනීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ විශිෂ්ට ප්‍රගතියක් 2014 වර්ෂයේදී ලබා ඇත. ශ්‍රීලසුබඅ මඟින් කොමිෂන් කරන ලද නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් ජාතික ජාලය සඳහා 2014 වර්ෂය තුළ පමණක් මෙගවොට් 45.00 ක් සම්බන්ධ කර ඇති අතර ආරම්භයේ සිට ගතහොත් එය මෙගවොට් 362 ක මුළු ප්‍රමාණයකි. ගෘහස්ථ, කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රවල ආරම්භ කරන ලද බලශක්ති කාර්යක්ෂමතා වැඩ පිළිවෙළ තුළින් 2014 වර්ෂයේදී ගි.වො.පැ. 448.3 ක බලශක්ති ඉතිරියක් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රීලසුබඅ සමත් වී ඇත. මෙය 2014 වර්ෂය තුළදී දිවයිනෙහි මුළු බලශක්ති පරිභෝජනයෙන් 4.1% කට සමාන වේ. තවදුරටත්, ඉන්ධන මාරු කිරීමේ වැඩසටහන තුළින් ඉන්ධන ලීටර් 715 ක, පෙට්‍රෝලියම් වායුව ටොන් 328.7 ක සහ දැව ඉන්ධන 476.3 ක සැළකිය යුතු ඉතිරියක් 2014 වර්ෂයේදී අත්පත් කරගෙන ඇත.

බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් බලගැන්වීමේ නියාමනයන් 2011 වර්ෂයේ ජූලි 20 වැනි දින ගැසට් නිවේදන අංක 1715/12 මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ක්ෂේත්‍රයේ මුළු බලශක්ති පරිභෝජනයෙන් 80%කට පමණ හේතු වන කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයතන 1500 ක ට වැඩි ප්‍රමාණයක් සඳහා යෝග්‍ය බලශක්ති කළමනාකරණ සැලසුමක් ක්‍රියාවට නැංවීමයි. 2011 වර්ෂය තුළ සිදු කරන ලද තවත් වැදගත් ක්‍රියාකාරකමක් වූයේ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා බලශක්ති කළමනාකරණ වැඩසටහනක් දියත් කිරීමයි. මොරටුව විශ්වවිද්‍යාලය, හොංකොං බහු තාක්ෂණික විශ්වවිද්‍යාලය සහ ආසියානු නගර සඳහා පිරිසිදු වායු මූලපිරීම් (CAI Asia) මධ්‍යස්ථානයේ සහයෝගය සමඟින් බලශක්ති කාර්යක්ෂමතා සහ පාරිසරික තිරසර ප්‍රවාහනය ($E^3ST$) පිළිබඳ සම්මන්ත්‍රණයක් සහ ධාවන චක්‍ර සකස් කිරීම පිළිබඳ පුහුණු වැටසටහනක් පවත්වන ලදී. ප්‍රවාහන ක්ෂේත්‍රයේ අදාළ සංවිධාන මෙම මූලපිරීම නොකඩවා යොදවා ගනු ඇතැයි ද එමඟින් සැලකිය යුතු ප්‍රවාහන ඉන්ධන ඉතිරියක් සමඟින් නාගරික වාතයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

අනාගතය දෙස බැලීමේදී බලශක්තිය සඳහා ඉහළ යන ගෝලීය ඉල්ලුමට සහ පරිසරයට ඇති ඉහළ යන අවධානමට සාපේක්ෂව ශ්‍රීලසුබඅ යේ වගකීම් විශාල වශයෙන් වර්ධනය වේ. තිරසාර සංකල්පවල සහායෙන් හැකි උපරිම මට්ටමින් සාමාජීය සහ පාරිසරික බැඳියාවක් ආරක්ෂා කර ගනිමින් දිවයිනෙහි ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ දායකත්වය සහතික කිරීම අපගේ කාර්යභාරය වේ.

**ආචාර්ය තුසිත සුගතපාල**
**අධ්‍යක්ෂ ජනරාල්**

# අපගේ දැක්ම

බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

# අපගේ මෙහෙවර

ගවේෂණය, සූසාධනය, පහසුකම් සැපයීම, පර්යේෂණ සහ සංවර්ධන මෙන්ම දැනුම් කළමනාකරණය තුලින් දේශීය බලශක්ති ප්‍රභව සංවර්ධනයට සහ බලශක්ති සම්පත් ඉතිරි කරගැනීමටත් සිදු කෙරෙන්නා වූ ජාතික ව්‍යායාමයට මඟ පෙන්වීම සහ එමගින් ස්වාභාවික, මානව සහ ආර්ථික සම්පත් සුරැකිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මග සැලසීම.



## අධ්‍යක්ෂ මණ්ඩලය - 2014

**සභාපති**
ප්‍රසාද් ගල්හේන මහතා

**සාමාජිකයින්**

ධාරා විජේතිලක මහත්මිය
ලේකම්
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

අබ්දුල් මජීඩ් මහතා
අතිරේක ලේකම් (සංවර්ධන)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

එම්. ඒ. තාජුඩීන් මහතා
අතිරේක ලේකම්
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

තනුජා මුරුගේෂන් මහත්මිය
අතිරේක ලේකම් (පාලන)
ඉඩම් හි ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඒ. එල්. ඒ. අශෝක සිරිවර්ධන මහතා
අතිරේක ලේකම් (පාලන)
කෘෂිකර්ම අමාත්‍යාංශය

කුමාරි සෝමරත්න මහත්මිය
අතිරේක ලේකම් (පාලන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ගාමිණී ගමගේ මහතා
අතිරේක ගේකම් (පරිසර ප්‍රතිපත්ති)
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

ආර්. එම්. ඩබ්. රත්නායක මහතා
අතරේක ලේකම් (තාක්ෂණික)
ප්‍රවාහන අමාත්‍යාංශය

ජේ. ජී. එල්. එස්. ජයවර්ධන මහතා
අධ්‍යක්ෂ
විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය

එස්. එස්. මුදලිගේ මහතා
අධ්‍යක්ෂ (සංවර්ධ හා ජාතික සැලසුම්)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

ඒ. ඩබ්. එම්. සරත්චන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ (ව්‍යාපෘති, තාක්ෂණික)
ප්‍රවාහන අමාත්‍යාංශය

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
මහජන උපයෝගීතා කොමිසන් සභාව

අරෝස් සන්දීප විජේසිංහ මහතා
ප්‍රධාන විධායක/සභාපති
ඔම්නිප්‍රො ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම

රුවන් විරාජ් වෛද්‍යරත්න මහතා
කළමනාකරණ අධ්‍යක්ෂ
හේලීස් ඇඩ්වාන්ටීස් ලිමිටඩ්

අශෝක අබේගුණවර්ධන මහතා
විධායක අධ්‍යක්ෂ
බලශක්ති සංශදය

සී. මහේෂ් එදිරිසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කොළඹ විශ්වවිද්‍යාලය

විනෝද් සමරවික්‍රම මහතා
අධ්‍යක්ෂ (විකුණුම්)
එරික්ෂන් ටෙලිකොමිනිකේෂන් ලංකා (පුද්.) සමාගම

ඩී. ඩී. ආනනන්ද නාමල් මහතා
සභාපති
ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය

හාතිය රණතුංග මහතා
සභාපති
කුඩා ජල විදුලිබලාගාර සංවර්ධකයන්ගේ සංගමය
එකෝ පවර් (පුද්.) සමාගම

**විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් – 2014**

සභාපති
**එස්.එස්. මුදලිගේ මහතා**
අධ්‍යක්ෂ (ජාතික ක්‍රසම්පාදන දෙපාර්තමේන්තුව)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජික
**ගාමිණී ගමගේ මහතා**
අතිරේක ලේකම් (පාරිසරික ප්‍රතිපත්ති)
පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය


සාමාජික
**ආනන්ද නාමල් මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

නිරීක්ෂක
**එස්. එම්. ජේ. ප්‍රියන්ත මහතා**
විගණන අධිකාරි
විගණකාධිපති දෙපාර්තමේන්තුව

නිරීක්ෂක
ඒල්. එන්. ඩී. කුමාරසිරි මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණන
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

**අපගේ කාර්ය මණ්ඩල සංයුතිය – 2014**

මුළු කාර්යමණ්ඩල සංඛ්‍යාව 105 දෙනෙකුගෙන් සමන්විත වන අප ආයතනය සාපේක්ෂව කුඩා ආයතනයකි.
අපගේ කාර්ය මණ්ඩල සංයුතිය පහත දක්වා ඇත.



# කාර්ය සාධන වාර්තාව



**<u>ප්‍රගතියේ සාරාංශය (2014ජනවාරි - 2014දෙසැම්බර්)</u>**
**<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය සාධනය (ශ්‍රීලසුබඅ)</u>**

ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගයන් ජාතික සහ පුද්ගල දෘෂ්ටිකෝණයෙන් බලශක්ති සුරක්ෂිතතාව මත ශක්තිමත් අවධාරණයක් ඇති කරනු ලැබේ. විශ්වසනීය, දැරීමට හැකි, සහ පිරිසිදු බලශක්තිය සියලු අවස්ථාවලදී සියලු ජනතාවට ලබා ගැනීමට හැකි තත්ත්වයක් ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රී.ල.සු.බ.අ) දිවයින තුළ සියලු ආකාරයේ පුනර්ජනනීය බලශක්ති වැඩි වශයෙන් යොදා ගැනීම සහ තිරසර භාවිතය ප්‍රවර්ධනය කරනු ලබන කේන්ද්‍රීය රාජ්‍ය ආයතනයයි. විශේෂයෙන් දැරිය හැකි මිලකට සමස්ත ශ්‍රී ලංකාවටම අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීම සම්බන්ධයෙන් සහ තාප විදුලි බලය උත්පාදනය සඳහා අපනයන කරනු ලබන පොසිල ඉන්ධන මත විශාල වශයෙන් රඳා පැවතීම හේතුවෙන් ආර්ථිකය මත ඇතිකර දැඩි අහිතකර බලපෑම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය වර්තමානයේදී අභියෝග රැසකට මුහුණු දී සිටී. මෙම තත්ත්වය වැළැක්වීම සඳහා රජය විසින් පහත අරමුණු පිහිටුවා ඇත;

- ආනයනික පොසිල සඳහා විකල්පයක් ලෙස වර්ෂ 2020 වනවිට නව පුනර්ජනනීය ඉන්ධන භාවිතයෙන් ජාල විදුලියෙන් 20%ක් උත්පාදනය කිරීම.
- බලශක්ති සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම තුළින් වර්ෂ 2020 වනවිට මුළු බලශක්ති පරිභෝජනයෙන් 10%ක් අඩු කිරීම.


**2014-2015 වර්ෂයේදී මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී.ල.සු.බ.අ විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සාරාංශයක් පහත දක්වා ඇත**

සාරාංශය:


- ☐ මෙ.වො. 191.93ක මුළු නව පුනර්ජනනීය බලශක්ති උත්පාදනයක් සඳහා හේතු වන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 91ක් අනුමත කර ඇත.
- ☐ 2016 වර්ෂය වනවිට නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයනිගෙන් (NRE) බලශක්ති උත්පාදනය 10%ක් දක්වා වැඩි කර ගැනීමේ ප්‍රතිපත්තිමය ඉලක්කය ඊට පෙර 2014 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීමට හැකි විය.
- ☐ හම්බන්තොට සූර්ය උද්‍යානයේ මුළු විදුලිබල උත්පාදනය මෙ.වො.පැ. 1354 (ශ්‍රී.ල.රු.මි 28) ක් වන අතර ඉඳුරාන කුඩා ජල විදුලි බලාගාරයේ මුළු විදුලිබල උත්පාදනය මෙ.වො.පැ. 182 (ශ්‍රී.ල.රු.මි 2.9)කි.
- ☐ කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් ගි.වො.පැ. 97.4 ක් ඉතිරි කිරීම.
- ☐ ඩීසල් ලීටර මිලියන 11 ක්, උඳුන් තෙල් ලීටර මිලියන 8 ක් සහ ඉන්ධන දැව කි.ග්‍රෑ.මිලියන 0.2 ක් ඉතිරි කර ගැනීමට හැකි විය.
- ☐ බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සඳහා නව ගැසට් නිවේදනයක් ප්‍රසිද්ධියට පත් කරන ලදී (2014 අප්‍රේල් 17 දිනැති අංක 1858/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය).
- ☐ සම්මත විදුලිබල මිළදී ගැනීමේ ගිවිසුම (SPPA) යටතේ නව පුනර්ජනනීය බපශක්ති අය ක්‍රමය සඳහා පාර්ලිමේන්තු නියෝගයක් ලබා ගන්නා ලදී.
- ☐ සූර්ය සම්පත් සිතියම (සූර්ය ඇට්ලසය) සම්පූර්ණ කරන ලදී.
- ☐ කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල ජල විදුලි බලශක්ති සම්පත් විභවය ඇගයීම සම්පූර්ණ කර ඇත.
- ☐ CFL බලශක්ති නාමකරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වේ. තරු ශ්‍රේණිගත කිරීම් පිළිබඳ මිනුම් ලකුණු වෙනස් කරමින් පවතී.
- ☐ ශීතකරණ පරීක්ෂා කිරීමේ පහසුකම NERD මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කරන ලද අතර සිවිලිං පංකා පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරයක් සහ විදුලි බල්බ පරීක්ෂා කිරීමේ පරීක්ෂාණාගාරයක් ආරම්භ කරන ලදී.

| අංකය | ක්‍රියාකාරකම්වල විස්තරය (ප්‍රධාන සාක්ෂාත් කිරීම්) |
|---|---|
| | ***පුනර්ජනනීයබලශක්තිසංවර්ධනය( REACT යටතේ)*** |
| **1** | <u>**සම්පත් වෙන් කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම්**</u><br><br>දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් වාණිජ පරිමාණයේ ව්‍යාපෘති දක්වා සංවර්ධනය කිරීම වේගවත් කිරීම සඳහා ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති බලපත්‍ර (EP) සහ තාවකාලික අනුමැතීන් (PA) නිකුත් කිරීම ශ්‍රී.ල.සු.බ.අ භාරගෙන ඇත.<br><br>✓ **නිකුත් කරන ලද තාවකාලික අනුමැතීන් (PA)**<br>ජල විදුලි - 42 (මෙ.වො.46.44)<br>ජෛවස්කන්ධ - 7 (මෙ.වො.41.24)<br>මුහුදු රළ - 1 (මෙ.වො.4)<br>✓ **නිකුත් කරන ලද බලශක්ති බලපත්‍ර (EP)**<br>ජල විදුලි - 26 (මෙ.වො.35.76)<br>ජෛවස්කන්ධ - 3 (මෙ.වො.2.79)<br>සූර්ය - 5 (මෙ.වො.50)<br>✓ **කොමිෂන් කරන ලද ව්‍යාපෘති**<br>ජලවිදුලි - 6 (මෙ.වො.8.7)<br>ජෛවස්කන්ධ - 2 (මෙ.වො.7)<br>සුළං - 1 (මෙ.වො.10W)<br><br>පුනර්ජනනීය බලශක්ති භාවිතා කරමින් 2014 වර්ෂය තුළදී කරන ලද මුළු විදුලිබල උත්පාදනය ගි.වො.පැ.4885.8කි.<br>මීට අමතරව, ශ්‍රී.ල.සු.බ.අ විදුලි යන්ත්‍රාගාර ක්‍රියාත්මක කිරීමෙන් සූර්ය විදුලිබලය කි.වො.පැ. 1,354,878 ක් සහ ජල විදුලි බලය කි.වො.පැ. 182,548 ක් උත්පාදනය කරන ලදී. |
| | <u>**පුනර්ජනනීය බලශක්ති සම්පත් ඇගයීම**</u><br><br>ශ්‍රී.ල.සු.බ.අ, සම්පත් සිතියම්ගත කිරීම තුලින් පුනර්ජනනීය බලශක්ති සම්පත් තොග ලේඛණයක් සකස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මූලික අදියරේදී සූර්ය, සුළං, කුඩා ජල විදුලි සහ ජෛවස්කන්ධ සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.<br><br>✓ මුළු දිවයිනම ආවරණය කරමින් සකස් කරන ලද සූර්ය සම්පත් ඇට්ලසය ප්‍රසිද්ධියට පත් කරන ලදී.<br>✓ හම්බන්තොට සහ කිලිනොච්චි සූර්ය මැනුම් මධ්‍යස්ථානවලින් ලැබුණු දත්ත එක්රැස් කිරීම, සංරක්ෂණය සහ විශ්ලේෂණය කිරීම සිදු කරමින් පවතී.<br>✓ කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල ජල විදුලි බලශක්ති සම්පත් විභවය ඇගයීම සම්පූර්ණ කර ඇත.<br>✓ ජාතික සුළං නිර්දේශන ජාල කුළුණ (WRNM) පිහිටුවන ලද අතර සුළං දත්ත එක්රැස් කිරීම සිදු කරමින් පවතී.<br>✓ සංවර්ධකයින් හට එක් ස්ථානයක වර්ෂයක දත්ත රු. 250,000/-ක මුදලට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් මිලදී ගත හැක.<br>✓ කර්මාන්ත සහ ගෘහස්ත අංශයන්හි ජෛව ස්කන්ධ පරිභෝජනය සොයා ගැනීම සඳහා ඇගයීම සිදු කර ඇති අතර ලියා පදිංචි ව්‍යාපෘතිවල ජෛව ස්කන්ධ සැපයුම් ප්‍රදේශ සිතියම්ගත කිරීම සම්පූර්ණ කර ඇත.<br>✓ සම්පත් ඇගයීම සඳහා වන 'සුළං ඇට්ලස විශ්ලේෂණ සහ යෙදවුම් වැඩසටහන'(**WAsP**) භාවිත කරමින් සුළං සම්පත් ඇගයීම් සිදු කරමින් පවතී.<br>✓ මැනුම් කුළුණු වැඩබිම් 5ක දත්ත වලංගු කිරීම, සම්පත් සංඛ්‍යානය කිරීම සම්පූර්ණ කර තොරතුරු වාර්තා 5ක් සම්පාදනය කර ඇත. |


- ✓ ADB අරමුදල් ලැබූ අධ්‍යයනයකින් මන්නාරම් කලාපයේ සුළං විභවය මෙ.වො. 375ක් වන බව අනාවරණය කර ගෙන ඇති අතර සුළං උද්‍යානයක් සකස් කිරීමේ සංකල්පය සාකච්ඡා මට්ටමේ පවතී.
- ✓ ADB ක්වොන්ටම් ලීප් WRA ව්‍යාපෘතිය යටතේ උතුරු කලාපයේ නව මැනුම් කුළුණු 3ක් ස්ථාපිත කරමින් පවතින අතර 2015 ජනවාරි වන විට කුළුණු පිහිටුවා කොමිෂන් කිරීමට අපේක්ෂා කෙරේ.





*ශ්‍රී ලංකාවේ සූර්ය සම්පත් සිතියම*





*සුළං මාපක කුළුණු පිහිටා ඇති ස්ථාන*





*සබරගමුව පළාතේ ජල සම්පත් සිතියම*





*කර්මාන්ත ජෛව ස්කන්ධ පරිභෝජනය සමඟ ජෛව ස්කන්ධ සැපයුම් ප්‍රදේශ දක්වන දළ සිතියම*





හුණු කර්මාන්ත ප්‍රදේශවල ජෛවස්කන්ධ පරිභෝජනය සමඟ ජෛවස්කන්ධ සැපයුම් ප්‍රදේශ





තේ කර්මාන්යේ ජෛවස්කන්ධ පරිභෝජනය ඇගයීම





විදුලි බල ව්‍යාපෘතිවල ජෛව ස්කන්ධ සැපයුම් ප්‍රදේශ - 'ඩෙන්ඩ්‍රෝ'




විදුලි බල ව්‍යාපෘතිවල ජෛව ස්කන්ධ සැපයුම් ප්‍රදේශ - 'කෘෂිකාර්මික අපද්‍රව්‍ය'



සුළං දත්ත විශ්ලේෂණය



මන්නාරම් කලාපයේ සුළං සම්පත් සිතියම

**<u>පුනර්ජනනීය බලශක්ති සේවාවන්</u>**

විදුලිය සඳහා RE විසඳුම් හඳුන්වාදීම, RE බලශක්ති යෙදවුම් ප්‍රවර්ධනය කිරීම සහ තාක්ෂණ ව්‍යාප්තිය වැනි විවිධ පුනර්ජනනීය බලශක්ති සේවාවන් ශ්‍රී.ල.සු.බ.අ විසින් සිදු කරනු ලැබේ. මෙම සේවාවන් ග්‍රාමීය ප්‍රජාවන් දක්වා පුළුල් කර ඇත.

- ✓ ඌව පළාතේ සූර්ය නිවාස ඒකක 100ක් ස්ථාපනය කර ඇති අතර සූර්ය නිවාස ඒකක 1200ක් ස්ථාපනය කරමින් පවතී.
- ✓ ග්‍රාමීය ජල විදුලි ව්‍යාපෘති 10ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා සහාය ලබා දෙන ලදී.
- ✓ ජීව වායු ඒකක 133ක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලද අතර 60ක් සම්පූර්ණ කර ඇත.
- ✓ ජෛව ස්කන්ධ වියළීමේ ව්‍යාපෘති 6ක් මිරිස්ස, ගන්දර, තල්අරඹ ධීවර සමාජවල ක්‍රියාවට නංවන ලද අතර නොච්චියාගම සූර්ය බල ශක්තියෙන් ක්‍රියාත්මක වතුර පොම්පයක් ස්ථාපිත කරන ලදී.
- ✓ RE හඳුන්වා දීම, RE හි භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සහ ජීව වායු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 38ක් පවත්වා ඇත.



*ජාලයෙන් පිටත සූර්ය පද්ධතිබෙදා දීම - මොණරාගල*



*සුනිත්‍යාලෝක ව්‍යාපෘතිය*

4

**<u>දායක අරමුදල් ලැබූ ව්‍යාපෘති</u>**

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සැපයූ ප්‍රධාන RE සංවර්ධන ව්‍යාපෘති දෙකක් ශ්‍රී.ල.සු.බ.අ විසින් හඳුන්වා දෙන ලදඅතර වර්තමානයේදී ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘති දෙක වන්නේ,

1. සූර්ය පියසි ව්‍යාපෘතිය - සූර්ය පියසි උපාංග සංවර්ධනය කිරීම තුළින් ජාතික ජාලයට කි.වො. 1000ක් එක් කිරීම.
2. වතු ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘතිය - මෙ.වො. 1.3ක් ජාලයට ලබා දෙමින් අත්හැර දමා තිබුණු ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘති 19ක් පමණ පුනරුත්ථාපනය කර සම්බන්ධ කරන ලදී.

තවද, UNDP/GEF/FAO අරමුදල් ලැබූ "සුනිත්‍ය ජෛව ස්කන්ධ බලශක්ති නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ නවීන ජෛව-බලශක්ති තාක්ෂණික ක්‍රමවේදය" නමැති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතින අතර ශ්‍රීලසුබඅ ව්‍යාපෘතිය සඳහා ක්‍රියාත්මක කිරීමේ සහකරු වේ. පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

- ✓ ජෛව ස්කන්ධ සැපයුම් ව්‍යාපාරය හා සම්බන්ධ සැපයුම් දාම මෙහෙයුම්කරුවන් හඳුනාගැනීම සහ විස්තීර්ණ ජෛව ස්කන්ධ පුහුණුවක් සඳහා පාඨමලා මොඩියුලයක් සකස් කිරීම.

***බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ( EnMAP යටතේ)***

**බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් පහත දක්වා ඇති සමස්ත බලශක්ති ඉතිරි කිරීම 2014 වර්ෂය තුළදී සාක්ෂාත් කර ගැනීමට හැකි විය;**

| ක්‍රියාකාරකම | ඉතිරි කිරීම | |
|---|---|---|
| | වර්ගය | වටිනාකම |
| තේ කර්මාන්තශාල 30ක බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම | විදුලිය | මෙ.වො.පැ.400 |
| ආයතන 60ක සිටින ක්‍රියාකාරී බලශක්ති කළමනාකරුවන් | විදුලිය | ගි.වො.පැ.15 |
| SLNEEA සම්මාන වැඩසටහන | විදුලිය | ගිවො.පැ.6 |
| | ඩීසල් | ලීටර් මිලියන11 |
| | උඳුන් තෙල් | ලීටර් මිලියන 8 |
| | ඉන්ධන දැව | කි.ග්‍රෑ.මී.0.2 |

**මෙයට අමතරව 2013-2014 බිස්නස් මැනේජ්මන්ට් බියුරෝ ලංකා පෞද්ගලික සමාගම විසින් පවත්වන ලද "බලපෑම් ඇගයීම් අධ්‍යයනය"හි දක්වා ඇති පරිදි තේ, රබර්, රෙදිපිළි සහ ඇඟලුම්, හෝටල්, රෝහල් සහ ආහාර කර්මාන්තවල ක්ෂේත්‍ර විශේෂිත වැඩසටහන් ක්‍රියාවට නැංවීම තුළින් ගි.වො.පැ. 76ක මුළු විදුලි බල ඉතිරියක් සාක්ෂාත් කර ගෙන ඇත.**

| ක්ෂේත්‍රය | ඉතිරි කිරීම (ගි.වො.පැ./වර්ෂය) |
|---|---|
| තේ | 6 |
| රබර් | 13 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 26 |
| හෝටල් | 17 |
| ආහාර කර්මාන්තය | 9 |
| රෝහල් | 5 |
| **එකතුව** | **76** |

**1** <u>බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම</u>

ISO50001 ආයතන සඳහා බලශක්ති කළමනාකරණ පද්ධති හඳුන්වා දීම තුළින් වාණිජ, කර්මාන්ත සහ ගෘහස්ථ ක්ෂේත්‍රයන්හි බලශක්ති සංරක්ෂණයට ශ්‍රී.ල.සු.බ.අ පහසුකම් සපයයි.

- ✓ බලශක්ති කළමනාකරුවන් 180 දෙනෙකු සහ බලයලත් බලශක්ති විගණකවරුන් 13 දෙනෙකු පත් කරන ලදී.
- ✓ බලශක්ති කළමනාකරුවන් සඳහා පුහුණු ආයතන 3ක් සහ බලශක්ති විගණකවරුන් සඳහා එක් පුහුණු මධ්‍යස්ථානයක් ලියාපදිංචි කරන ලදී.
- ✓ කර්මාන්ත අංශ 5ක් සඳහා බලශක්ති පරිභෝජන අවම මට්ටම් කෙටුම්පත් කරන ලදී.
- ✓ බලශක්ති කළමණාකරුවන්, බලශක්ති කළමනාකරණ නිලධාරින් සහ විදුලි නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන්/ දේශන 10ක් පවත්වන ලදී.
- ✓ බලශක්ති කළමනාකරණ සංකල්ප හඳුන්වා දීම සඳහා පෙර පාසල් ගුරුවරියන්, බාල දක්ෂයින් සහ මහ ජනතාව සඳහා වැඩමුළු/සම්මන්ත්‍රණ 7ක් පවත්වන ලදී.
- ✓ TRI හි සහයෝගීත්වයෙන් තේ කර්මාන්තශාලා 60ක සහභාගීත්වය සමඟ තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ බලශක්ති පරිභෝජන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් සමූහයක් පවත්වන ලදී.
- ✓ සු.බ.අ හි තාක්ෂණික මග පෙන්වීම යටතේ සහ TRI හි කළමනාකාරීත්වයෙන් මෙම තේ කර්මාන්තශාලාවල ස්වයංක්‍රීය බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවන ලදී.

1




*2014 මාර්තු 06 දින කොළඹ ජයවර්ධන කේන්ද්‍රයේදී පැවති LED එකලස් කිරීමේ වැඩමුළුව*



*2014 සැප්තැම්බර් මස 27 දින මහරගම, තරුණ මධ්‍යස්ථානයේදී පැවති "බලශක්ති කාර්යක්ෂමතා මුළුතැන්ගෙය" වැඩමුළුව*

**2** <u>සම්මත සහ නියාමන හඳුන්වා දීම</u>

කර්මාන්ත, ගෘහස්ථ සහ වාණිජ ක්ෂේත්‍රයන්හි බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම කළමනාකරණය කිරීම සඳහා දැනුවත්භාවය ඇති කිරීම සමඟින් විධිමත් නියාමන මැදිහත්වීම් සම්පාදනය කිරීම සඳහා ශ්‍රී.ල.සු.බ.අ විසින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී.

- ✓ CFL බලශක්ති නාමකරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. තරු ශ්‍රේණිගත කිරීමේ මිනුම් ලකුණු ප්‍රතිශෝධනය කරමින් පවතී.
- ✓ ADB ප්‍රදාන යටතේ ශීතකරණ පරීක්ෂා කිරීමේ පහසුකමක් NERD මධ්‍යස්ථානයෙහි පිහිටුවනලදී.
- ✓ සිවිලිම් විදුලි පංකා පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරයක් සහ බල්බ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරයක් පිහිටුවීම ආරම්භ කර ඇත.
- ✓ නලාකාර ප්‍රතිදීප්ත විදුලි බල්බ සහ ප්‍රතිදීප්ත බල්බ බැලැස්ටර සඳහා වන නියාමන සකස් කරමින් පවතී.
- ✓ "ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා භාවිත සංග්‍රහය - 2008" සඳහා වෙනස් කිරීම් සිදු කරමින් පවතී.
- ✓ ආයතන 11ක ISO50001 විගණන 12ක් පවත්වන ලද අතර ආයතන 2කට ISO 50001 සහතික පත් ලබා දෙන ලදී. ඉතිරි ආයතන 9 සඳහා 2015 ජනවාරි 09 වන විට ISO 50001 සහතික ලබා දීමට අපේක්ෂා කෙරේ.
- ✓ සහතිකය මේ වන විටත් ලබා ගෙන ඇති සමාගම් සඳහා පරීක්ෂණ විගණන 03ක් පවත්වන ලදී.





*ජා ඇල, NERD මධ්‍යස්ථානයේ ශීතකරණ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය ඉදිකිරීමින්*

**3**

**<u>උපදේශාත්මක සහ උපදේශන සේවාවන්</u>**

ගැටළු සඳහා පිළිතුරු සමඟ උපදේශන සේවා ලබා දීම, ඉල්ලීම මත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ISO 50001 විගණන සඳහා පැවැත්වීම ආදිය මගින් සු.බ.අ කර්මාන්ත, වාණිජ සහ රාජ්‍ය අංශ ආයතනවල බලශක්තිය හා සම්බන්ධ ගැටළු විසඳීම සඳහා සහාය ලබා දේ.

- ✓ කර්මාන්ත, වාණිජ සහ රාජ්‍ය අංශ ආයතනවල බලශක්තිය හා සම්බන්ධ ගැටළු විසඳීම සඳහා උපදේශන 90ක් ලබා දෙන ලදී.
- ✓ රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය බලශක්ති විගණන 2ක් සහ සවිස්තර බලශක්ති විගණන 2ක් සම්පූර්ණ කරන ලදී.
- ✓ 2014 වර්ෂය සඳහා නව සමාගම් 6ක් ඇතුළුව ESCO සමාගම් 28ක් ලියාපදිංචි කරන ලද අතර යාවත්කාලීන කරන ලද ESCO ලැයිස්තුව වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරන ලදී.
- ✓ 2014 නොවැම්බර් මස 27 වැනි දින මෝටර් නැවත එතීමේ යහ භාවිතයන් පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.



*ශ්‍රීලසුබඅ නිලධාරින් තේ කර්මාන්තශාලාවක් නිරීක්ෂණය කරමින්*



*රත්නපුර **TRI** හි පැවති සමාලෝචන වැඩසටහන*

**4**

**<u>ජයග්‍රහණ සඳහා සම්මාන ප්‍රධානය කිරීම</u>**

ශ්‍රී ලංකා බලශක්ති කාර්යක්ෂමතා සම්මාන වැඩසටහන(SLNEEA) පැවැත්වීම තුලින් කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි බලශක්ති කළමනාකරණ භාවිතයන් SLSEA මගින් උනන්දු කෙරේ.

- ✓ ශ්‍රී ලංකා ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ SLNEEA උත්සවය 2014 නොවැම්බර් 25 වැනි දින BMICH හිදී පැවැත්විණි. බලශක්ති ඉතිරි කිරීමෙහි අත්පත් කරගත් ජයග්‍රහණ වෙනුවෙන් ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මානය (NEEA), විශිෂ්ට බලශක්ති සේවා සමාගම සඳහා වූ සම්මානය (ESCO) සහ වර්ෂයේ විශිෂ්ටතම බලශක්ති කළමණාකරු සම්මානය ජයග්‍රාහකයින් සඳහා ප්‍රදානය කරන ලදී.



***SLNEEA සම්මාන ලාභීන්- 2014***

*ප්‍රොෆෙෂනල් MET කන්සල්ටන්සි සර්විසස් (පෞද්) සමාගම, එනර්ජි සොල්ව් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම, ඕවර්සීස් රියලිටි (සිලෝන්) පීඑල් සී සහ බ්‍රැන්ඩික්ස් සමූහයේ කොම්ෆෝර්ට් වෙයාර් (පෞද්.) සමාගමට රන් සම්මාන ප්‍රදානය කරන ලදී.*

5

<u>**පර්යේෂණ සහ සංවර්ධන සිදු කිරීම**</u>

ශ්‍රී ලංකාවේ බලශක්ති කළමනාකරණ ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා ලෝකයේ නව සහ නව්‍ය තාක්ෂණයන් යොදා ගැනීමේ විභවය ගවේශණය කිරීම සඳහා මුලපිරීම් සිදු කර ඇත. එක් ප්‍රධාන මුලපිරීමක් වන්නේ කොළඹ ප්‍රදේශය සඳහා ධාවන චක්‍රයක් සකස් කිරීමයි.

- ✓ E$^3$ST (බලශක්ති කාර්යක්ෂමතා සහ පාරිසරික තිරසර ප්‍රවාහනය) පිළිබඳ සම්මන්ත්‍රණයක් 2014 අගෝස්තු මස 28 සහ 29 දිනවල පිළිවෙළින් කොළඹ සහ මහනුවරදී පවත්වන ලදී.
- ✓ විශ්වවිද්‍යාල 04ක සහභාගීත්වය සමඟින් එම වැඩසටහන ගාල්ල, යාපනය සහ මහනුවර ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කරන ලදී.
- ✓ වඩා හොඳ වායු ගුණාත්මකභාවයක් (BAQ) පිළිබඳ ඒකාබද්ධ සම්මන්ත්‍රණය 2014 සමඟ සහ ආසියාවේ 8 වැනි අන්තර් රාජ්‍ය කලාපීය EST වැඩමුළුව සඳහා සම්බන්ධ වූ අතර 'නගරයන්හි ජීවන තත්ත්වයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සුනිත්‍ය ප්‍රවාහන විසඳුම් ඉහළ නැංවීම' පෙර-වැඩසටහනක් BMICH හීදී 2014 නොවැම්බර් මස 18 වැනි දින පවත්වන ලදී.




***2014 අගෝස්තු මස 28 වැනි දින BMICH හි පැවැති E$^3$ST වැඩසටහන***




***2014 අගෝස්තු මස 29 වැනි දින මහනුවර මහවැලි රීච් හෝටලයේදී පැවති E$^3$ST වැඩසටහන***





***BAQ 2014– 2014 නොවැම්බර් 28 දින පැවති 'නගරයන්හි ජීවන තත්ත්වයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සුනිත්‍ය ප්‍රවාහන විසඳුම් ඉහළ නැංවීම'පෙර-වැඩසටහන***

<table>
<tr><th></th><th>සුනිත්‍ය බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම (සළකා බලමින් පවතී)</th></tr>
<tr><td>1</td><td>
<u>ප්‍රතිපත්තිමය මැදිහත්වීම සහ ආයතනික රාමු</u><br>
මේ යටතේ ප්‍රධාන වශයෙන් අරමුණ කරනු ලබන්නේ ශ්‍රී ලංකාව සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති පනත සංශෝධනය කිරීම වේ.<br><br>
✓ පාරිසරික සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ උප-කමිටුවේ මඟපෙන්වීම යටතේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරන ලදී.<br>
✓ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ඇතුලත් කිරීම් ලබාදෙන ලද අතර විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය උපාය මාර්ග සකස් කරමින් පවතී.<br>
✓ පාරිසරික සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් පත්කළ නීති නිලධාරින් කණ්ඩායමක් සමඟ ශ්‍රී.ල.සු.බ.අ පනත සඳහා වැඩිදියුණු කිරීම්/වෙනස් කිරීම් හඳුන්වාදීම ආරම්භ කරන ලදී.<br>
✓ IPCC 5 වැනි ඇගයීම් වාර්තාව ඉලක්ක කර ගනිමින් 'කාලගුණික විපර්සාස' පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.<br>


<br>
පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුව<br>


<br>
IPCC 5වැනි ඇගයීම වාර්තාව පිළිබඳ කාලගුණික විපර්යාස සම්මන්ත්‍රණය
</td></tr>
<tr><td>2</td><td>
<u>සුනිත්‍ය බලශක්ති තාක්ෂණ සංරක්ෂණ සහ බලශක්ති තොරතුරු විශ්ලේෂණය</u><br>
මෙය ශ්‍රී.ල.සු.බ.අ, කර්මාන්ත, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන අතර සුනිත්‍ය බලශක්ති පදනම් කරගත් මනා දැනුමක් ඇතිකරගැනීම සඳහා මුල පිරීමකි.<br><br>
✓ 2014 නොවැම්බර් මස 21 වැනි දින හිදී ජාතික බලශක්ති සම්මන්ත්‍රණය පවත්වන ලද අතර එහිදී පර්යේෂකයින්, විද්වතුන් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සමූහයක් සඳහා පර්යේෂණ සහ නව තාක්ෂණික සොයාගැනීම් පිළිබඳ තාක්ෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.<br>
✓ 2013 ශ්‍රී ලංකා ජාතික තුලනය සම්පාදනය කරන ලදී<br>
✓ ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගීත්වයෙන් බලශක්තිය හා සම්බන්ධ ආර්ථික දර්ශක සකස් කරන ලදී.<br>
✓ ගෘහස්ථ කාබන් විමෝචනය සහ ගෘහස්ථයන්ගේ ජාල-මානනය විශ්ලේෂණය කිරීම හා සම්බන්ධ උපකරණ/දර්ශක සකස් කරන ලදී.
</td></tr>
</table>




*ජාතික බලශක්ති සම්මන්ත්‍රණය 2014*





*බලශක්ති තුලනය 2013*

**3** <u>**සුනිත්‍ය බලශක්ති මැදිහත්වීම් පිළිබඳ තත්ත්ව පත්‍රිකා**</u>

ශ්‍රී.ල.සු.බ.අ සුනිත්‍ය බලශක්ති සංවර්ධනය පිළිබඳ ජාතික වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට සම්බන්ධ නව්‍ය ව්‍යාපෘති සම්පාදනය කිරීම පිණිස විවිධ සංකල්ප හඳුන්වාදීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

- ✓ විදුලිබල ඉල්ලුම අඩු කිරීමේ ක්‍රමවේදයක් ලෙස පවතින වේලාව ඉදිරියට ගෙන ඒම පිළිබඳ තත්ත්ව පත්‍රිකාවක් සම්පාදනය කර ඇත.
- ✓ උප-බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පිළිබඳ තත්ත්ව පත්‍රිකා සම්පාදනය කරමින් පවතී
- ✓ මුහුදු ජලයෙහි ලවණ ඉවත් කිරීම පිළිබඳ විශේෂ අවධාරණයක් සමඟින් ජලය භාවිතා කිරීම හා සම්බන්ධ බලශක්ති සහ ආර්ථිකය අධ්‍යයනය කරමින් පවතී.




*වේලාව ඉදිරියට ගෙන ඒමේ ප්‍රතිඵලයක් ලෙස විදුලිබල ඉල්ලුම දක්වන වක්‍රයෙහි ප්‍රක්ෂිප්ත විතැන් වීම*

| | *දැනුම කළමනාකරණය (සළකා බලමින් පවතී)* |
|---|---|

**1** <u>**පාසල් විෂය නිර්දේශය සකස් කිරීම**</u>

බලශක්ති අධ්‍යාපනය සඳහා ස්වයංක්‍රී පද්ධතියක් සකස් කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ පාසල් විෂය නිර්දේශය සඳහා බලශක්තිය හා සම්බන්ධ දැනුම සහ ක්‍රියාකාරකම් ඇතුලත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

- ✓ 6 ශ්‍රේණිය සහ 11 ශ්‍රේණිය විද්‍යා විෂය ධාරාව සඳහා බලශක්තිය හා සම්බන්ධ දැනුම සහ ක්‍රියාකාරකම් හඳුවන්වා දී ඇති අතර නව නිර්දේශය යටතේ 2015 වර්ෂයේදී එය ක්‍රියාවට නංවනු ඇත.
- ✓ අනෙකුත් ශ්‍රේණී සඳහා බලශක්ති ක්‍රියාකාරකම් හඳුවන්වාදීම සිදු කරමින් පවතී.
- ✓ බලශක්ති විෂය පිළිබඳව නව විෂය නිර්දේශයෙහි අනතර්ගතය පැහැදිලි කිරීම සඳහා විද්‍යා සහ පරිසර විෂය නිර්දේශ සැකසීමේ කණ්ඩායම සඳහා සහායක වැඩමුළුවක් පවත්වන ලදී.




***2014 සැප්තැම්බර් 30 සහ ඔක්තෝබර් 01 වැනි දින පැවති දෙදින වැඩමුළුව***

**2** <u>**බලශක්ති අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීම**</u>

ගුරු-ශිෂ්‍ය ප්‍රජාව බලශක්ති කළමනාකරණයෙහි සහ ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී පුනර්ජනනීය බලශක්ති පරිභෝජනයෙහි නිරත කරවීම සඳහා පාසල් බලශක්ති සමාජ, බලශක්ති දින සැමරුම් සහ 'බලශක්ති තරුව' තරඟය ඇතුලත් විස්තීර්ණ වැඩසටහනක් සකස් කරමින් පවතී.

- ✓ 1AB සහ මහින්දෝදය පාසල්වලින් අයදුම්පත් 300ක් ලැබුනු අතර ඒ අතරින් බලශක්ති සමාජ 120ක් පිහිටුවන ලදී. වැඩිදුර පිහිටුවීම් සිදු කරමින් පවතී.
- ✓ 2013 කාර්ය සාධනය පදනම් කර ගනිමින් විශිෂ්ට බලශක්ති සමාජ තෝරාගත් අතර මුදල් ත්‍යාග ලබා දෙන ලදී.
- ✓ 2014 සැප්තැම්බර් මස 15 සහ 16 දින පැවති රැස්වීම් තුලින් බලශක්ති අධ්‍යාපන වැඩසටහන පිළිබඳව අධ්‍යාපන බලධාරීන්ගේ ප්‍රතිචාර එක්රැස් කරගත් අතර ඒවා වැඩසටහනෙහි ව්‍යුහය වැඩිදියුණු කිරීම සඳහා සහ ක්‍රියාවට නැංවීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා භාවිතා කරන ලදී.
- ✓ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඇතිව චක්‍රලේඛයක් සකස් කරමින් පවතී.

<table>
<tr><td></td><td>




*2013 විශිෂ්ට බලශක්ති සමාජ සම්මානය*

*අධ්‍යාපන බලධාරීන් සඳහා වැඩමුළුව*

</td></tr>
<tr><td>3</td><td>

<u>සුනිත්‍ය බලශක්ති කලාපය (SEZ)- කෝට්ටේ</u>

චක්‍රීය ආර්ථික සංකල්ප හඳුන්වාදීම හා භාවිතය සහ බලශක්තිය පිළිබඳව දැනුවත් වූ ප්‍රජාවක් ඇති කිරීම සඳහා කෝට්ටේ ප්‍රදේශයේදී සුනිත්‍ය බලශක්ති කලාප සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන ලදී.

- ✓ කෝට්ටේ මහ නගර සභාව සමඟ අවබෝධතා ගිවිසුමතට එළඹුනු අතර SEZ පිහිටුවීම සඳහා පහසුකම් සපයන ලදී.
- ✓ කලාපයෙහි බලශක්තිය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහනක් දියත් කරන ලද අතර බලශක්ති සමාජ 10 ක් පිහිටුවන ලදී.
- ✓ ග්‍රාම නිලධාරිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ✓ සියළු රජයේ ආයතන සඳහා සන්නිවේදන නිලධාර්න පත් කරන ලද අතර බලශක්ති විගණන සිදු කිරීම සඳහා ESCOS තෝරාගැනීම ඇගයීමේ අදියරෙහි පවතී.




*කෝට්ටේ කලාපයේ පාසල් සඳහා බලශක්තිය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන*

</td></tr>
<tr><td>4</td><td>

<u>ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සහ ප්‍රතිරූපය නැංවීමේ ක්‍රියාකාරකම්</u>

සුනිත්‍ය බලශක්ති සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී.ල.සු.බ.අ වෙනත් ජාතික ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ වේ.

- ✓ පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා 'දැයට කිරුළ' ප්‍රදර්ශනයේදී එළිහමන් කුටි සහ ගෘහස්ථ කුටි 2ක් ඉදිරිපත් කරන ලද අතර ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වන ලද ජංගම සේවාවන් සඳහා සහභාගී වූ මහජනතාව අතර අත් පත්‍රිකා 60,000ක් පමණ බෙදා දෙන ලදී.

</td></tr>
</table>

| | |
|---|---|
| | ✓ කොළඹ, රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් විසින් සංවිධානය කරන ලද 'එඩෙක්ස්' ප්‍රදර්ශනයේ හරිත කලාපය යටතේ ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරන ලදී.<br>• අධිකාරියෙහි සඳහා ප්‍රතිරූපය ගොඩනැංවීමේ උපාය මාර්ගයක් ලෙස ශ්‍රී.ල.සු.බ.අ විසින් පවත්වන ලද සියළු ප්‍රධාන උත්සව සම්මත උත්සව කළමනාකරණ මාර්ගෝපදේශ අනුව සම්බන්ධීකරණය කරන ලදී.<br> <br>***2014 'දැයට කිරුළ' ප්‍රදර්ශනය*** |

# මූල්‍ය තත්ව ප්‍රකාශනය



<u>අවසන්</u>

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
**2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| | සටහන | 2014 | | 2013 ප්‍රතිප්‍රකාශිත | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 3 | 1,123,609,447 | | 1,228,166,858 | |
| කෙරෙමින් පවතින කාර්යයන් | 4 | 7,624,591 | | 49,461,726 | |
| ආයෝජන | 5 | 71,072,018 | 1,202,306,056 | 58,528,095 | 1,336,156,679 |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබීමට ඇති දේ | 6 | 9,548,263 | | 11,110,775 | |
| වෙනත් ජංගම වත්කම් | 7 | 34,351,481 | | 15,678,223 | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8 | 298,543,573 | 342,443,317 | 269,792,827 | 296,581,825 |
| **මුළු වත්කම්** | | | 1,544,749,373 | | 1,632,738,504 |
| **ස්කන්ධය සහ බැරකම්** | | | | | |
| **ස්කන්ධය** | | | | | |
| සමුච්චිත අරමුදල | 9 | 22,100,336 | | 22,100,336 | |
| ශුද්ධ අතිරික්තය | | 27,270,814 | | 15,732,229 | |
| විලම්භිත ප්‍රදාන | 10 | 1,123,633,991 | | 1,269,922,913 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 11 | 232,345,722 | | 206,561,051 | |
| සුනිත්‍ය සහතික කිරීමේ අරමුදල | | 73,321,629 | 1,478,672,492 | 69,554,046 | 1,583,870,575 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| ගෙවිය යුතු පාරිතෝෂික | | 8,247,505 | 8,247,505 | 7,298,903 | 7,298,903 |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙනත් ගෙවිය යුතු දේ | 12 | 52,663,940 | | 38,395,891 | |
| කෙටි කාලීන ප්‍රතිපාදන-විගණන ගාස්තු | | 1,622,636 | | 1,022,636 | |
| ඉඩම් අත්පත් කර ගැනීම මත ශුද්ධ තැන්පතු | | 3,542,800 | 57,829,376 | 2,150,500 | 41,569,027 |
| **මුළු ස්කන්ධය සහ වත්කම්** | | | 1,544,749,373 | | 1,632,738,504 |

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා සහ වෙනුවෙන්**

අධ්‍යක්ෂ (මූල්‍ය)   අධ්‍යක්ෂ ජනරාල්   සභාපති

**2014 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | සටහන | 2014<br>රු. | 2013<br>රු.<br>ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ක්‍රියාකාරකම්/ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදානය | 13 | 33,592,173 | 4,008,039 |
| ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන | 14 | 166,776,750 | 168,606,531 |
| භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන | | 81,999,500 | 80,100,000 |
| පරිසර අමාත්‍යාංශය | | 1,146,043 | |
| ADB G0303 ආදායම් ප්‍රදානය | | 4,404,284 | |
| ADB 2733 SRI ආදායම් ණය | | 786,109 | |
| වෙනත් ආදායම් | 15 | 117,590,567 | 106,810,919 |
| අඩු කලා වැට් බදු | | (10,286,572) | (8,255,905) |
| **මුළු ආදායම** | | **396,008,855** | **351,269,583** |
| **වියදම** | | | |
| ව්‍යාපෘති/ක්‍රියාකාරකම් වියදම | 16 | (104,921,382) | (45,268,770) |
| වැටුප් සහ දීමනා | 17 | (61,749,916) | (52,373,903) |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 18 | (1,323,070) | (2,216,937) |
| සැපයුම් | 19 | (9,687,374) | (7,804,909) |
| නඩත්තු වියදම් | 20 | (8,015,311) | (6,454,313) |
| කොන්ත්‍රාත් සේවා | 21 | (26,994,516) | (23,117,830) |
| ක්‍රමක්ෂය වියදම් | 22 | (166,776,750) | (168,606,531) |
| වෙනත් පුනරාවර්තන වියදම් | 23 | (5,628,271) | (3,669,374) |
| **කාල පරිච්ඡේදය සඳහා වියදම** | | **(385,096,589)** | **(309,512,567)** |
| පෙර වර්ෂයේ ගැලපීම් | | 626,320 | (190,108) |
| **අතිරික්තය / (ඌනනය)** | | **11,538,586** | **41,566,908** |

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය** <u>**අවසන්**</u>

**2014 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය | 10,912,266 | | 35,853,079 | |
| පසුගිය වර්ෂයේ ගැලපීම | 626,320 | | (190,107) | |
| පාරිතෝෂික අරමුදල සඳහා මාරු කිරීම් | | | | |
| **ගැලපීම්:** | | | | |
| පාරිතෝෂික අරමුදල සඳහා මාරු කරන ලද | | | - | |
| ක්‍රමක්ෂිත ප්‍රදාන (ලැබූ අරමුදල් සඳහා) | (166,776,750) | | (168,836,532) | |
| පොළී ආදායම | (1,829,641) | | (3,409,193) | |
| සේවා පාරිතෝෂික වෙන්කිරීම් | 948,602 | | 1,062,527 | |
| ක්ෂය | 166,776,750 | | 168,836,532 | |
| | 10,657,546 | | 33,316,306 | |
| වෙනත් ජංගම වත්කම් වල (වැඩිවිම)/අඩුවීම | (17,110,745) | | 9,162,537 | |
| ජංගම බැරකම් වල වැඩිවීම/(අඩුවීම) | 16,260,349 | | (8,621,761) | |
| මෙහෙයුම් වලින් උත්පාදිත මුදල් | 9,807,150 | | 33,857,082 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ලැබීම් | | 9,807,150 | | 33,857,082 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (17,822,411) | | (33,416,828) | |
| කෙරෙමින් පවතින වැඩ | (2,559,793) | | (8,757,199) | |
| FD සහ TBවල ආයෝජිත/ආයෝජනයන්හි පොළිය | (10,714,282) | | 388,252 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | (31,096,486) | | (41,785,775) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| විලම්භිත ප්‍රදාන | 20,487,828 | (38,310,239) | 41,873,961 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 25,784,671 | | 72,960,122 | |
| සමුච්චිත අරමුදල | - | | - | |
| සුනිත්‍ය සහතිකවීමේ අරමුදල | 3,767,583 | | 3,020,941 | |
| පාරිතෝෂික ගෙවීම් | - | | (92,231) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | 50,040,081 | | 117,762,794 |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | | 28,750,746 | | 109,834,101 |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 269,792,827 | | 159,958,726 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 298,543,573 | | 269,792,827 |

අවසන්

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
**2014 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය**

| විස්තරය | සමුච්චිත අරමුදල | ශුද්ධ අතිරික්තය/ හිඟය | විලම්භිත ප්‍රදාන | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | සුනිත්‍ය සහතිකවීමේ අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| **2013.12.31 දිනට ශේෂය** | **22,100,336** | **15,732,229** | **1,269,922,913** | **206,561,051** | **69,554,046** | **1,583,870,575** |
| 2013 වර්ෂය සඳහා වැඩිවීම/අඩුවීම | - | 10,912,266 | (146,288,922) | 25,784,671 | 3,767,583 | (105,824,403) |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | 626,320 | | | | 626,320 |
| **2014.12.31 දිනට ශේෂය** | 22,100,336 | 27,270,814 | 1,123,633,991 | 232,345,722 | 73,321,629 | 1,478,672,492 |

අංක 5 සිට 17 දක්වා පිටු වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඒකාබද්ධ කොටසක් තනයි.

## 2014.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1. සංයුක්ත තොරතුරු

### 1.1 සාමාන්‍යය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (සුබඅ) 2007 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින ස්ථාපිත කරන ලදි. බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) කාමර අංක 3G-17 හි ස්ථානගත කර ඇත.

1985 අංක 02 දරන බලශක්ති පරිවර්තන (ECF) පනත 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මඟින් අවලංගු කර ඇත. 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට ECF සියලු වත්කම් සහ බැරකම් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ස්වයංක්‍රීයව SEA හි ගිණුම් වලට මාරු වී ඇත.

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝගය පර්දි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ පැවති ආලෝකකරණය සඳහා වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කරන ලදි. ඒ අනුව RCL හි වත්කම්, බැරකම් සහ සේවකයින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස ලංවීම වෙත මාරු කරන ලදි.

### 1.2 අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම, බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, බලශක්තිය ලබා දීමෙහි සහ තොරතුරු කළමනාකරණයෙහි සුරක්ෂිත භාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීමට බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග සහ සංරක්ෂණ ක්‍රියාවට නැංවීම.

### 1.3 සේවක සංඛ්‍යාව

2014.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව - 105

### 2.1 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1.1 සකස් කිරීමේ පදනම අනුකූල වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2014 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රී.ල.සු.බ.අ) ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇත.

ශ්‍රී.ල.සු.බ.අ හී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනමින් සකස් කර ඇත. අවශ්‍ය තැන් වලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වල අනාවරණය කර ඇත.

### 2.1.2 සංසන්දනාත්මක සංඛ්‍යා

වර්තමාන මූල්‍ය වර්ෂයෙහි වෙනස්කම් සඳහා අනුකූල වන පර්දි සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර ඇත. සටහන් අංක 24ට අනුව 2013 වර්ෂය සඳහා සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශයට පත් කර ඇත.

### 2.2.1 රජයේ ප්‍රදානයන්සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය අනාවරණය කිරීම

රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදාන සහ පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙදට බෙදා වෙන් කරනු ලැබේ. පුනරාවර්තන වියදම්, කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී ආදී වියදම් පියවීම සඳහා යොදා ගනු ලැබේ. ප්‍රාග්ධන ප්‍රධාන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ.

ව්‍යාපෘති වියදම් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වලින් සමන්විත වන බැවින් එම වියදම් ප්‍රාග්ධන ප්‍රධාන වලින් දරනු ලැබේ.

වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ක්‍රමානුකූල සහ තර්කාන්විත පදනමින් හඳුනාගනු ලබන රජයේ ප්‍රාග්ධන ප්‍රධාන විලම්භී. ආදායමක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රධානය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ, පුනරාවර්තන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් හා සම්බන්ධ වන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**2.2 දීර්ඝ කාලීන ආයෝජන සඳහා ගිණුම් තැබීම**

රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර ඇති අතර පිරිවැයට දක්වා ඇත.

**2.2.3 ආදායම හඳුනාගැනීම**

බලශක්ති බලපත්‍ර ගාස්තු, විදුලිය විකිණීම, පුහුණු පාඨමාලා ගාස්තු, ප්‍රදර්ශන ආදායම, උපකරණ කුලියට දීම සහ වෙනත් ආදායම මඟින් ආදායම නියෝජනය වේ.
සුනිත්‍ය සහතිකවීමේ අරමුදලෙහි පොළිය ආදායමක් ලෙස සලකනු ලැබේ. එහි කොටසක් නැවත ආයෝජනය කරන ලද අතර කොටසක් අරමුදල් 2 නඩත්තු කිරීම/ ඒ සඳහා ආදායම ඉපැයීමේ පිරිවැය සඳහා පරිභෝජනය කරන ලදි.

**2.2.4 අනිශ්චිත බැරකම් සහ අනිශ්චිත වත්කම්**

2008 වර්ෂයේ මාර්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සාම්ප්‍රධායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලද විදුලි බලය සඳහා ඇස්තමේන්තුගත රු. මි. 897 ක් ශ්‍රී.ල.සු.බ.අ. විසින් ලංකා විදුලිබල මන්ඩලයට ගෙවිය යුතු වේ. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මේ වන විට ක්‍රමයක් නොමැති අතර ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් හෝ සෙස් බදු හෝ පුරස්කාර තුලින් උපයාගත යුතු වේ. මේවා භාණ්ඩාගාර අනුමැතියට යටත් වේ. එබැවින් මෙය අවිනිශ්චිත බැරකමක් ලෙස පමණක් අනාවරණය කර ඇත.

**2.3 දේපල, පිරියත සහ උපකරණ**

**2.3.1 පිරිවැය සහ තක්සේරු කිරීම**

ස්ථාවර වත්කම්, පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂය ට දක්වා ඇත. රේඛීය ක්‍රමය භාවිතා කරමින් ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත.

**වර්ෂයක කාලයක් සඳහා ක්‍රමක්ෂය අනුපාතය පහත දක්වා ඇත.**

| අයිතමය | ක්‍රමක්ෂය අනුපාතය |
|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25% |
| මොටර් ප්‍රවාහන | 20% |
| ඡායාපිටපත් යන්ත්‍රය | 25% |
| පරිගණක | 33.33% |
| විදුලි භාණ්ඩ | 25% |
| පුස්තකාල පොත් | 20% |
| බලශක්ති උපකරණ | 33.33% |
| ප්‍රදර්ශන උපකරණ | 25% |
| සුළං කුළුණු | 20% |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5% |
| සූර්ය බලශක්ති ව්‍යාපෘති | |
| A. සූර්ය පනේල | 5% |
| B. යකඩ ව්‍යුහ | 10% |
| C. ගොඩනැගිලි | 5% |
| D. ස්විච්ච්පන්න | 20% |
| E. අපවර්තක | 20% |
| F. ට්‍රාන්ස්ෆෝමර | 5% |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 33.33% |
| I. සනීපාරක්ෂක සහ ජලනල වැඩ | 5% |
| J. රථහැන් | 20% |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 25% |
| L. මෙවලම් | 33% |
| M. යන්ත්‍ර සූත්‍ර | 20% |
| H. වෙනත් | 20% |

**2.4 බැරකම් සහ ප්‍රතිපාදන**

**2.4.1 පාරිතෝෂිත**

මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුප පදනම් කර ගනිමින් අඩ සමක වැටුප හා සමාන මුදලක් පාරිතෝෂිකයකඤ් වශයෙන් සියළුම සේවකයින් සඳහා වෙන් කර ඇත.

**2.4.2 EPF & ETF**

අදාල නීති සහ නියාමනයන්ට අනුව EPF & ETF සඳහා දායකවීමට සේවකයින් හිමිකම් ලබයි. EPF & ETF සඳහා ශ්‍රී.ල.සු.බ.අ. හි දායකත්වය පිළිවෙළින් 12% සහ 3% කි.

**2.4.3 මහවැලි ඉඩම**

හම්බන්තොට සූර්ය බලාගාරය සඳහා අත්පත් කර ගත් අක්කර 50ක මහවැලි ඉඩම සඳහා හිමිකම් ඔප්පුව මේ වන තෙක් ලැබී නොමැත. එබැවින් එය තක්සේරු කර හෝ ගිණුම්වල වත්කමක් ලෙස ඇතුලත් කර නොමැත.

**2.4.4 කළමනාකරණ මණ්ඩල අනුමැතිය**

මෙම මූල්‍ය ප්‍රකාශන 2016 ජනවාරි මස අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

**සටහන 3 :**
**දේපල,පිරියත සහ උපකරණ**

**ස්ථාවර වත්කම්**

| විස්තරය | 2013.12.31 දිනට ශේෂය රු. | 2014 කාල පරිච්ඡේදය තුළදී අත්පත්කර ගැනීම් | 2014.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | 105,624 | 105,624 |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 13,861,495 | 3,204,060 | 17,065,555 |
| මෝටර් වාහන | 46,016,550 | 1,349,569 | 47,366,119 |
| ඡායාපිටපත් යන්ත්‍රය | 2,994,191 | - | 2,994,191 |
| පරිගණක | 29,172,570 | 3,858,251 | 33,030,820 |
| විදුලි භාණ්ඩ | 280,260 | 148,937 | 429,197 |
| පුස්තකාල පොත් | 453,352 | - | 453,352 |
| බලශක්ති උපකරණ | 80,069,435 | 8,467,500 | 88,536,935 |
| සුළං කුළුණු සහ උපකරණ | 45,615,151 | 117,347 | 45,732,498 |
| ශීතකරණ පරීක්ෂා කිරීමේ පහසුකම | - | 42,165,337 | 42,165,337 |
| සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති: | | - | |
| A. සූර්ය පනේල | 659,048,348 | 1,462,000 | 660,510,348 |
| B. යකඩ ව්‍යුහ | 222,261,738 | - | 222,261,738 |
| C. ගොඩනැගිලි | 127,059,617 | 352,608 | 127,412,225 |
| D. ස්විච්විපන්න | 13,973,767 | - | 13,973,767 |
| E. අපවර්තක | 78,637,410 | - | 78,637,410 |
| F. ට්‍රාන්ස්ෆෝමර | 45,753,626 | - | 45,753,626 |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 31,257,940 | (0) | 31,257,940 |
| I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම් | 166,473,900 | 0 | 166,473,900 |
| J. රැහැන් | 100,224,571 | - | 100,224,571 |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 3,014,584 | - | 3,014,584 |
| L. මෙවලම් | 13,977,290 | 196,930 | 14,174,220 |
| M. යන්ත්‍රසූත්‍ර | 4,001,375 | - | 4,001,375 |
| H. වෙනත් | 60,039,664 | 0 | 60,039,664 |
| | | - | |
| ප්‍රදර්ශන උපකරණ | 354,853 | - | 354,853 |
| දත්ත සහ තොරතුරු | | 896,800 | 896,800 |
| | **1,744,541,687** | **62,324,962** | **1,806,866,649** |

**ක්‍රමක්ෂය ගිණුම**

| ක්‍රමක්ෂය | ක්‍රමක්ෂය අනුපාතිකය % | 2013.12.31 දිනට ශේෂය රු. | 2014 වර්ෂය සඳහා ක්‍රමක්ෂය රු. | 2014.12.31 දිනට ශේෂය රු. | 2014.12.31 දිනට ශුද්ධ පොත් අගය රු. |
|---|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25 | 11,432,830 | 1,978,455 | 13,411,285 | 3,654,270 |
| මෝටර් වාහන | 20 | 45,679,344 | 524,235 | 46,203,579 | 1,162,540 |
| ඡායාපිටපත් යන්ත්‍රය | 25 | 1,790,387 | 459,480 | 2,249,867 | 744,324 |
| පරිගණක | 33.33 | 21,191,190 | 4,124,389 | 25,315,579 | 7,715,241 |
| විදුලි භාණ්ඩ | 25 | 225,541 | 36,531 | 262,072 | 167,125 |
| පුස්තකාල පොත් | 20 | 412,177 | 9,801 | 421,978 | 31,374 |
| බලශක්ති උපකරණ | 33.33 | 77,471,097 | 4,731,111 | 82,202,208 | 6,334,727 |
| සුළං කුළුණු සහ උපකරණ | 20 | 19,343,581 | 9,606,811 | 28,950,392 | 16,782,106 |
| ශීතකරණ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය | 20 | - | 7,855,460 | 7,855,460 | 34,309,877 |
| සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති: | | - | - | | - |
| A. සූර්ය පනේල | 5 | 82,755,642 | 32,952,418 | 115,708,060 | 544,802,288 |
| B. යකඩ ව්‍යුහ | 10 | 54,407,192 | 22,226,174 | 76,633,366 | 145,628,372 |
| C. ගොඩනැගිලි | 5 | 15,619,956 | 6,379,203 | 21,999,159 | 105,413,066 |
| D. ස්විච්විපන්න | 20 | 8,192,838 | 2,794,753 | 10,987,591 | 2,986,176 |
| E. අපවර්තක | 20 | 40,101,334 | 15,727,482 | 55,828,816 | 22,808,594 |
| F. ට්‍රාන්ස්ෆෝමර | 5 | 5,660,777 | 2,287,681 | 7,948,458 | 37,805,168 |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 33.33 | 19,943,521 | 10,418,271 | 30,361,792 | 896,148 |
| I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම් | 5 | 20,125,251 | 8,323,695 | 28,448,946 | 138,024,954 |
| J. රැහැන් | 20 | 48,669,669 | 20,044,914 | 68,714,583 | 31,509,988 |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උප | 25 | 1,792,905 | 753,646 | 2,546,551 | 468,033 |
| L. මෙවලම් | 33.33 | 11,269,770 | 2,733,532 | 14,003,302 | 170,918 |
| M. යන්ත්‍රසූත්‍ර | 20 | 988,980 | 800,275 | 1,789,255 | 2,212,120 |
| H. වෙනත් | 20 | 28,947,121 | 12,007,933 | 40,955,054 | 19,084,610 |
| | | - | - | | - |
| ප්‍රදර්ශන උපකරණ | 25 | 353,725 | 500 | 354,225 | 628 |
| දත්ත සහ තොරතුරු | 0 | | - | | 896,800 |
| | | **516,374,829** | **166,776,749** | **683,151,578** | **1,123,609,447** |

**සටහන 4 : කෙරෙමින් පවතින වැඩ**

| | 31.12.2014<br>රු | 31.12.2013<br>රු |
|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති ඇගයීම | 2,377,000 | 2,377,000 |
| හම්බන්තොට සූර්ය බලශකිත් උද්‍යානය | 4,332,591 | 4,332,591 |
| ඉදුරාන කුඩා ජල විදුලි ව්‍යාපෘතිය | | 352,608 |
| රෙෆ්‍රිජිරේටෝ පරීක්ෂණ උපකරණය | - | 42,104,027 |
| නව රහහල නිෂ්පාදනය | 689,500 | 295,500 |
| වැටුප් ගෙවීමේ පද්ධතිය | 25,500 | |
| දත්ත සහ තොරතුරු | 200,000 | |
| | 7,624,591 | 49,461,726 |

**සටහන 5 : ආයෝජන**

ස්ථාවර තැන්පතු (බොරුල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති)

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය | 2014.12.31 දිනට තැන්පතු | 2013.12.31 දිනට තැන්පතු |
|---|---|---|---|---|---|
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10416 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10432 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10408 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10343 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10335 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10378 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10386 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10327 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10319 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10297 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10289 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-102262 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 2-0061-05-10254 | 1,200,000 | 1,200,000 |
| 25.09.2011. | 25.09.2014 | 10.5% | 2-0061-04-12376 | 450,000 | 450,000 |
| 05.10.2011. | 05.10.2014 | 10.0% | 2-0061-03-09834 | 2,800,000 | 2,800,000 |
| 02.05.2014 | | | | 8,000,000 | |
| 20.10.2014 | | | | 400,000 | |
| | | | | **27,250,000** | **18,850,000** |

භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුවේ ප්‍රධාන ශාඛාව

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය | 2014.12.31 දිනට තැන්පත් | 2013.12.31 දිනට තැන්පත් |
|---|---|---|---|---|---|
| 18.01.2011. | 17.01.2014 | 10.85% | LKB00615C156 | 13,846,931 | 12,489,626 |
| 09.07.2011. | 11.07.2014 | 10.25% | LKB00314J011 | 29,975,087 | 27,188,469 |
| | | | | 43,822,018 | **39,678,095** |
| **මුළු එකතුව** | | | | **71,072,018** | **58,528,095** |

**සටහන 6 - ලැබිය යුතු දේ**

ස්ථාවර තැන්පත් වලින් ලැබිය යුත් පොළී

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | 2013.12.31 දිනට තැන්පතු | 2014 සඳහා ලැබිය යුතු රු. | 2014 සඳහා ලැබිය යුතු රු. |
|---|---|---|---|---|---|
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 21.09.2011. | 21.09.2014 | 10.5% | 1,200,000 | 1,200,000 | 24,750 |
| 25.09.2011. | 21.09.2014 | 10.0% | 450,000 | 450,000 | 8,906 |
| 05.10.2011. | 05.10.2014 | 10.0% | 2,800,000 | 2,800,000 | 42,972 |
| 02.05.2014 | | | - | 8,000,000 | 401,096 |
| 20.10.2014 | | | - | 400,000 | 5,129 |
| | | | 18,850,000 | 27,250,000 | 779,853 |

භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබිය යුතු පොළී

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | 2013.12.31 දිනට තැන්පතු | 2014 සඳහා ලැබිය යුතු රු. | 2014 සඳහා ලැබිය යුතු රු. |
|---|---|---|---|---|---|
| 18.01.2011. | 17.01.2013. | 10.85% | 12,489,626 | 13,846,931 | 928,651 |
| 09.07.2011. | 11.07.2013 | 10.25% | 27,188,469 | 29,975,087 | 914,534 |
| | | | **39,678,095** | **43,822,018** | **1,843,185** |

**ලැබිය යුතු ආදායම - බලශක්ති උපකරණ කුලියට දීම**

| | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|
| | රු | රු |
| බාන්ඩ්ස් ෆිනිෂින්ග් සමාගම - 2005 | 4,850 | 4,850 |
| බීඑම්අයි හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගම - 2005 | 7,200 | 7,200 |
| හේලිස් ඉන්ඩස්ට්‍රියල් සොලූෂන්ස් -2005 | 500 | 500 |
| එනර්ෆැබ් (පෞද්.) සමාගම -2006 | 3,750 | 3,750 |
| ඇක්සස් එනර්ජි සොලූෂන්ස් | 500 | 500 |
| ඇක්සස් එනර්ජි සොලූෂන්ස් | 500 | 500 |
| බ්‍රැන්ඩික්ස් | 2,650 | 2,650 |
| ඩිමෝ | 1,600 | 1,600 |
| එනර්ජි සොලූෂන්ස් සමාගම | 5,750 | 5,750 |
| නැෂනල් ක්ලීනර් ප්‍රොඩක්ෂන් සෙන්ටර් | 750 | 750 |
| මාර්ස් ඇක්ටිව් | 2,400 | 2,400 |
| ඉංජිනියරින් ඩිසයින් සෙන්ටර් | - | |
| ග්ලයිඩ් (පෞද්.) සමාගම | 150 | 150 |
| ස්ලීමා | 250 | 250 |
| | 30,850 | 30,850 |
| ලැබිය යුතු දේ -විදුල්කා ආදායම | 374,675 | 374,675 |
| විදුලි උත්පාදන -ඉඳුරාන | | |
| පුහුණු වැඩසටහන | | |
| විදුලි උත්පාදනය -හම්බන්තොට | 7,188,425 | 2,812,500 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | |
| ලැබිය යුතු දේ -සේවකයින් | 2,138 | 2,138 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් VAT බැර | (1,096,987) | 4,702,660 |
| VAT ආදායම | | |
| ගෙවන ලද VAT | | |
| පීපල්ස් ට්‍රැවල් (පෞද්.) සමාගම | 8,871 | 8,871 |
| දේශීය පුහුණු වැඩසටහන | 417,253 | |
| | **6,925,225** | **7,931,694** |
| **මුළු එකතුව** | 9,548,263 | 11,110,775 |

| | 31.12.2014 | 31.12.2013. |
|---|---|---|
| | රු | රු |
| **සටහන 7: වෙනත් ජංගම වත්කම්** | | |
| **අත්තිකාරම්** | | |
| CFL ණය | | - |
| බලශක්ති අරමුදලින් අධිකාරියේ අරමුදලට ලැබීම් | 20,435,260 | |
| අධිකාරියේ අරමුදලින් බලශක්ති අරමුදලට ලැබීම් | | 7,444,270 |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් ණයට ගත් | | |
| ලංවිම ලැබීම් | | |
| උත්සව අත්තිකාරම් | | |
| වෛද්‍ය රක්ෂණ | 500 | 500 |
| අත්තිකාරම් ගිණුම | | 98,500 |
| ජාතික ජල සම්පත් මණ්ඩලය | | |
| අත්තිකාරම්, තැන්පතු, ඉන්ධන ආදී | 186,500 | 136,500 |
| විශේෂ අත්තිකාරම් | | |
| ආපදා ණය | | |
| ලංවිම තැන්පතු - හම්බන්තොට | 52,000 | 52,000 |
| ලංවිම තැන්පතු- ඉඳුරාන | 62,500 | 62,500 |
| දුරකථන තැන්පතු | 351,048 | 8,775 |
| දුරකථන තැන්පතු - මොබිටෙල් | 2,000 | 2,000 |
| SWRDB ජාතික අනුස්මරණ අරමුදල- තැන්පතු | 22,543 | 38,886 |
| සේවක පුහුණු වැඩසටහන් අත්තිකාරම් | | 187,450 |
| වැඩසටහන් සඳහා අත්තිකාරම් | 15,881 | 137,333 |
| තැන්පතු - හම්බන්තොට නේවාසිකාගාර කුලී | 132,000 | 132,000 |
| අත්තිකාරම් තැන්පතු - සිප්‍රින් වෝටර් පෞද්. සමාගම | 3,500 | 3,500 |
| ධීවර අමාත්‍යාංශය - දකුණු පළාත් සභාව | 1,800,000 | |
| අත්තිකාරම්-ඇමෙරිකන් ප්‍රිමියම් වෝටර් | 18,000 | |
| ගෙවිය යුතු තැන්පතු - පැරඩයිස් කොලේජ් | 10,000 | |
| අත්තිකාරම්-ජාතික තාරුණ්‍යය | 40,000 | |
| අත්තිකාරම් - ජේ ආර් ජයවර්ධන කේන්ද්‍රය | 5,000 | |
| අත්තිකාරම් - දිස්ත්‍රික් ලේකම් - කිළිනොච්චි | 240,000 | |
| අත්තිකාරම්-ශ්‍රී ලංකා ජාතික රෝහල | 475,000 | |
| අත්තිකාරම් -සත්ත්ව පාලන දෙපාර්තමේන්තුව, වයඹ පළාත | 2,500,000 | |
| | 26,351,732 | 8,304,214 |
| **සක්‍රිය අරමුදල** | | |
| ආපදා ණය | 7,870,760 | 7,288,521 |
| විශේෂ අත්තිකාරම් | 5,000 | 5,000 |
| උත්සව අත්තිකාරම් | 123,989 | 80,489 |
| | 7,999,749 | 7,374,010 |
| | **34,351,481** | **15,678,223** |

| | | |
|---|---|---|
| **සටහන 8: මුදල සහ මුදල් හා සමාන දෑ** | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව - බොරැල්ල | 213,443,382 | 207,151,805 |
| මහජන බැංකුව-SEA-078-1-001-8-8-503576 | 5,430,427 | 12,387,146 |
| මහජන බැංකුව-SEA-078-1-002-7-8-503576 | 4,578,684 | 4,578,684 |
| ලංකා බැංකුව-ටොරින්ටන්-සක්‍රිය අරමුදල | 1,460,067 | 1,463,745 |
| ලංකා බැංකුව-ටොරින්ටන්-අධිකාරියේ අරමුදල | 33,376,650 | 44,211,447 |
| ලංකා බැංකුව-ටොරින්ටන්-බලශක්ති අරමුදල | 40,254,363 | |
| | **298,543,573** | **269,792,827** |

**සටහන 9 : සමුච්චිත අරමුදල**

2007 ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට (SLSEA) මාරු කරන ලද බලශක්ති සංරක්ෂණ අරමුදලේ (ECF) සමුච්චිත අරමුදල සැප්තැම්බර් 30 වැනි දිනට එය පහත දෑ වලින් සමන්විත වේ :

| | | |
|---|---|---|
| 2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල | 7,076,392 | 7,076,392 |
| ආරම්භක ප්‍රාග්ධනය | 5,000,000 | 5,000,000 |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය- ප්‍රාග්ධන ප්‍රදාන | 5,761,145 | 5,761,145 |
| UNDP ප්‍රාග්ධන ප්‍රදාන | 3,612,560 | 3,612,560 |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය - දායක ප්‍රදාන | 650,239 | 650,239 |
| සුනිත්‍ය සහතිකවීමේ අරමුදල | | |
| එකතුව | 22,100,336 | 22,100,336 |

| සටහන 10: විලම්භීත ප්‍රදාන | 2014<br>රු | 2013<br>රු |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන 2008 | 33,687,060 | 33,687,060 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2009 | 11,705,408 | 11,705,408 |
| විදේශ ප්‍රදාන 2009 - ජපන් | 24,165,380 | 24,165,380 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2010 -හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය | 46,693,991 | 46,693,991 |
| -ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන | 10,563,444 | 10,563,444 |
| විදේශ ප්‍රදාන 2010-ජපන් | 11,419,569 | 11,419,569 |
| ප්‍රාග්ධන ප්‍රධාන 2011-ඉඳුරාන කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය (WIP) | 15,523,945 | 15,523,945 |
| -ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන - ඉඳුරාන MHP | 68,548,216 | 68,548,216 |
| විදේශ ප්‍රදාන 2011-ජපන් | 1,155,016,402 | 1,155,016,402 |
| - කොරියානු | 191,097,075 | 191,097,075 |
| විලම්භීත ප්‍රදාන -විදේශ ආධාර -2012 -ADB | 15,082,346 | 15,082,346 |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන-2012 | 23,497,861 | 23,497,861 |
| විලම්භීත ප්‍රදාන -ADB- 2013 | 40,560,683 | 40,560,683 |
| විලම්භීත ප්‍රදාන -KOIKA- 2013 | 35,662 | 35,662 |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන/FARDF -2013 | 41,873,961 | 41,873,961 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2014 | 20,487,827 | |
| **අඩුකලා:** | | |
| -ක්‍රමක්ෂය-2014 | (166,776,749) | |
| -ක්‍රමක්ෂය-2013 | (168,606,531) | (168,606,531) |
| -ක්‍රමක්ෂය-2012 | (161,433,593) | (161,433,593) |
| -ක්‍රමක්ෂය-2011 | (63,289,946) | (63,289,946) |
| - පසුගිය වර්ෂ සඳහා ක්‍රමක්ෂය | (26,218,020) | (26,218,020) |
| | **1,123,633,991** | **1,269,922,913** |

**සටහන 11:**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල**

| | | |
|---|---|---|
| RE ආදායම | 222,352,762 | 188,458,395 |
| උපකරණ කුලියට දීම සහ බලශක්ති විගණන | 13,459,090 | 12,284,781 |
| ඉතිරිකිරීම් ගිණුමේ පොළිය - NSB | 26,890,749 | 15,725,222 |
| WHT | (14,772) | |
| බලශක්ති අරමුදලේ වැඩසටහන්/ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් | (30,342,607) | (9,907,347) |
| විවෘත කළ BOC ඉතිරිකිරීමේ ගිණුම | 500 | |
| මාරුකරන ලද බලපත්‍ර ගාස්තු | | |
| | **232,345,722** | **206,561,051** |

**සටහන 12: ගෙවිය යුතු වෙනත්**

| | | |
|---|---|---|
| සුනිත්‍ය බලශක්ති අරමුදල | - | 7,444,270 |
| අධිකාරියේ අරමුදලට ගෙවිය යුතු | 20,435,260 | |
| සුනිත්‍ය බලශක්ති සහතිකවීමේ අරමුදල | | - |
| ස්විච් ඒෂියා පාලන ගිණුම | 4,548,176 | 4,548,176 |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය | 500 | 500 |
| උපචිත වියදම් | 16,722,218 | 23,208,177 |
| ඉදිරිපත් නොකළ චෙක්පත් | 129,837 | |
| ***ණයහිමියන්*** | | |
| පුනර්ජනනීය බලශක්ති-ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 1,667,500 | 1,667,500 |
| බලශක්ති උපකරණ අත්පත් කර ගැනීම | | |
| -ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 326,025 | 326,025 |
| ජෝන් කීල්ස් ඔෆිස් ඔටොමේෂන් | 128,999 | |
| ශ්‍රී ලංකා වාණිජ විවිධ නීතිගත සංස්ථාව | 202,359 | |
| මොරටුව විශ්වවිද්‍යාලය | 340,000 | |
| සයිබර්ලේට් සර්විසස් පෞද් සමාගම | 394,998 | |
| විදුලි පාරිභෝගිකයින්ගේ සංගමය | 1,662,852 | |
| විදුලිබල හා බලශක්ති ඌව පළාත් සභාව | 3,990,000 | |
| රඳවාගැනීම් | 549,392 | 519,392 |
| නාරාහේන්පිට ජාතික පොළ | 99,405 | 99,405 |
| වෙනත් | 827,958 | |

| | | |
|---|---|---|
| ***විවිධ ණය හිමියන්*** | | |
| ශ්‍රී ලංකා රේගුව | 310,748 | 310,748 |
| සුහසාධක සංගමය SEA | 442 | 442 |
| ගෙවිය යුතු විවිධ | | |
| | | |
| ***ආපසු ගෙවිය යුතු තැන්පතු*** | | |
| ඊ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 10,000 | 10,000 |
| ඊඑන්එල් කන්සල්ටන්ට් | 150,000 | 150,000 |
| ඊ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | | |
| සිග්මා ටෙක්නොලෝජීස් | 10,000 | 10,000 |
| රේන්කෝ රිනීවබල් එනර්ජි පෞද්ග සමාගම | 30,000 | 30,000 |
| ගාමිණී සේනානායක | | |
| විදුල්කා ප්‍රදර්ශනය | 9,256 | 9,256 |
| වාහන බැහැරකිරීමේ ටෙන්ඩරය | | 8,000 |
| ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 54,000 | 54,000 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු - වාහන | 14,000 | |
| ATA ඉන්ටර්නැෂනල් | 50,000 | |
| | **52,663,940** | **38,395,891** |

| | 31.12.2014 | 31.12.2013. |
|---|---|---|
| | රු | රු |
| **සටහන 13 : ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන** | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන | 54,080,000 | 43,600,000 |
| FR 295 (1) යටතේ මාරු ගෙවීම් | | - |
| FASRDF -2013 | | 2,282,000 |
| අඩුකලා: | | |
| හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය | - | - |
| කෙරෙමින් පවතින වැඩ | 2,559,793 | 8,457,133 |
| ප්‍රවර්තන වර්ෂය තුලදී අත්පත් කර ගන්නා ලද ප්‍රාග්ධන වත්කම් | 17,928,034 | 33,416,828 |
| | **33,592,173** | **4,008,039** |
| **සටහන 14 : ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන** | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 166,776,750 | 168,606,531 |
| පසුගිය වර්ෂය සඳහා ක්‍රමක්ෂය | | |
| | **166,776,750** | **168,606,531** |
| **සටහන 15 : වෙනත් ආදායම්** | | |
| බලශක්ති බලපත්‍ර ගාස්තු | 51,125,464 | 43,790,190 |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල පොළිය | 1,829,641 | 783,242 |
| SAARC බලශක්ති කේන්ද්‍රය | | |
| ආපදා ණය පොළිය | 293,874 | 296,166 |
| විශේෂ අත්තිකාරම් පොළිය | 2,201 | 2,953 |
| විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - හම්බන්තොට | 26,971,206 | 32,700,680 |
| විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - ඉඳුරාන | 2,332,224 | 2,403,238 |
| බලශක්ති කළමකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 1,238,086 | |
| විදුල්කා ප්‍රදර්ශනය (අනුග්‍රාහකත්වය) | | 2,750,000 |
| විදුල්කා ප්‍රදර්ශනය (වෙළඳසැල්) | | 2,925,801 |
| ස්විච් ඒෂියා වැඩසටහන | | |
| බලශක්ති කළමනාකරුවන් බලගැන්වීම | | 2,509,200 |
| වෙනත් ආදායම් | 2,826,039 | 2,537,257 |
| බලශක්ති අරමුලෙන් ලත් ආදායම | 20,435,260 | 3,907,347 |
| ආලෝකකරණය සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානය | | 16,200 |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | |
| වැට් බදු ගෙවීම සඳහා බලශක්ති අරමුදලෙන් මාරු කළා | | 3,932,740 |
| බදු අයකල හැකි ආදායම මත වැට් බදු | 10,286,572 | 8,255,905 |
| සුළං දත්ත ආදායම | 250,000 | |
| | **117,590,567** | **106,810,919** |

**සටහන 16 :ව්‍යාපෘති වියදම්**

| | | |
|---|---|---|
| **පුනර්ජනනීය බලශක්ති** | | |
| සුළං විභව අතිරික්තයෙන් හයිඩ්‍රජන් - ප්‍රවාහන යෙදවුම | | |
| විදුලි වාහන තාක්ෂණ සංවර්ධනය | | 12,990 |
| වෙළඳපොළ අපද්‍රව්‍යවලින් ජීව වායු උත්පාදනය කිරීමේ ප්‍රදර්ශක ව්‍යාපෘතිය | | 294,899 |
| ජෛව ඉන්ධන සඳහා ප්‍රමිත සකස් කිරීම | | |
| කාර්යක්ෂම දර උඳුන් ප්‍රවර්ධනය කිරීම | | |
| ශ්‍රී ලංකාවේ සංකීර්ණ භූමි භාග සඳහා ගැළපෙන කුඩා පරිමාණයේ WECS | | |
| දත්ත විකිණීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම | | |
| CDM ලියකියවිලි සකස් කිරීම සඳහා පෞද්ගලික අංශයට සහාය වීම | | |

| | 31.12.2014.<br>RS | 31.12.2013.<br>Rs |
|---|---|---|
| සියලු පැරණි සහ පවතින සුළං මිනුම් ස්ථාන ආවරණය කරමින් විස්තීර්ණ සුළං දත්ත සමුදායක් සකස් කිරීම | | |
| එක් එක් සම්පත් වර්ගය සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම් සකස් කිරීම සහ  ඇස්තමේන්තුගත RE විභවය පිළිබඳව වාර්තා කිරීම | | 402,231 |
| බලශක්ති වන වගා දිරි ගැන්වීම සහ ජෛව ස්කන්ධ කලාප 1ක් ස්ථාපිත කිරීම | | |
| දීර්ඝ කාලීන සුළං/සූර්ය මිනුම් ස්ථාන 10ක්  ස්ථාපිත කිරීම, උතුරු පළාතේ සුළං මිනුම් ස්ථාන 3ක් ස්ථාපිත කිරීම, මුහුදු රළ බලශක්ති සම්පත් ඇගයීමක් ආරම්භ කිරීම | | 1,437,640 |
| කිසියම් සම්පත් ස්ථානයක විභවය සම්පූර්ණයෙන්ම පරිභෝජනය කිරීම සඳහා නියාමනයන්ට සංශෝධන සිදු කිරීම | | |
| ජාල සම්බන්ධිත සූර්ය විදුලිබල උත්පාදනය සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම | | 8,290,344 |
| ජාල සම්බන්ධිත මෙ.වො. 100 ක සුළං ගොවිපොළක් සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම | | 900 |
| ජනාධිපති කාර්ය සාධන බලකා වාර්තාවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මේ වන විටත් යෝජිත නව ක්‍රමවේදය වලංගු කිරීම | | 126,000 |
| ජාතික ප්‍රමුඛතාවක් ලෙස NCRE කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අදාළ ආයතන සමඟ කටයුතු කිරීම | | 243,997 |
| පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම | | 652,056 |
| බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම) | | 1,268,635 |
| ජාතික ප්‍රමුඛතාවක් ලෙස NCRE කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අදාළ ආයතන සමඟ කටයුතු කිරීම | | |
| ඉඩම් ගැටළු සම්බන්ධයෙන් සේවා ලබා දීම සඳහා SEA තුළ මූලික සම්බන්ධතාවයක් සිථාපිත කිරීම | | |
| ව්‍යාපෘති අනුමත කිරීම හා සම්බන්ධ ගැටළු විසඳීම | | |
| පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම | | |
| ආරවුල් විසඳීම | | |
| RE ව්‍යාපෘතිවල බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම | | |
| බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම) | | |
| GIS රටවල ජල විදුලි බලයෙහි සම්පූර්ණ ආර්ථික විභවය සාක්ෂාත් කර ගැනීම | | |
| ජාලයෙන් පිටත යෙදවුම් සඳහා යොදා ගත හැකි ප්‍රදේශ සහ එවැනි ප්‍රදේශ සඳහා පවතින සම්පත් විකල්ප හඳුනා ගැනීම | | |
| ජාලයෙන් පිටත විදුලිබලය සැපයීමේ අවස්ථාව භාවිත කරමින් ගම්මාන 10ක් සඳහා විදුලිය ලබා දීම | | 1,383,733 |
| තෝරා ගත් ස්ථානයන්හි RE ව්‍යාපෘතිවල පශ්චාත් ස්ථාපිත ප්‍රගති අධීක්ෂණය සහ බලපෑම ඇගයීම | | 32,256 |
| ශ්‍රී ලංකා බලශක්ති තුලනය | | 1,407,068 |
| සුනිත්‍ය බලශක්ති ක්ෂේත්‍රය සඳහා සහායක ව්‍යාපෘති | | 270,008 |
| පිරිසිදු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | | 71,110 |
| RE සම්පත් සංවර්ධනය සකස් කිරීම | 1,260 | |
| සුළං සම්පත් ඇගයීම | 541,990 | |
| සූර්ය බලශක්ති ඇගයීම | 664,349 | |
| ජල විදුලි බලශක්ති ඇගයීම | 86,655 | |
| ජෛව ස්කන්ධ පරිභෝජනය ඇගයීම | 976,849 | |
| භූ තාප බලශක්තිය ඇගයීම | - | |
| ජෛව ස්කන්ධ බලශක්තිය ඇගයීම | 2,478,466 | |
| කෘෂිකර්මාන්තයෙහි බලශක්ති විභවය ඇගයීම | 1,102,094 | |
| සුළං සහ සූර්ය දත්ත නඩත්තු කිරීම | 2,281,009 | |
| තාක්ෂණික සාර සංග්‍රහයක් හඳුන්වාදීම | 850 | |
| වැඩපොළ පුහුණුව | 3,937,856 | |
| සම්පත් වෙන් කිරීම | 248,364 | |
| යාවත්කාලීන වෙබ් අඩවිගත GISපද්ධතියක් පවත්වාගෙන යෑම | 97,715 | |
| ජාල සම්බන්ධතාවයෙහි පැවතීම පිළිබඳව විමසමින්  CEB වෙත විස්තර යැවීම | 450 | |
| සැලසුම්කරණ/TEC රැස්වීම් නියෝජනය කිරීම | 102,567 | |
| නව ක්‍රමවේද සැකසීම සහ වෙන් කිරීම | 2,057 | |

| | 31.12.2014 | 31.12.2013. |
|---|---|---|
| | රු | රු |
| අතිවිශේෂ ගැසට් නියාමන | 610,146 | |
| PA & EP හි ප්‍රගතිය පවත්වා ගැනීම | 184,776 | |
| ව්‍යාපෘතියෙහි හිඟව පැවති කාර්යයන් නිම කිරීම | 87,009 | |
| කාර්ය සාධනය පරීක්ෂා කිරීමේ වැඩසටහනක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 41,035 | |
| ජාතික ජාලයට ප්‍රවේශයක් නොමැති ප්‍රදේශ සඳහා විදුලිය ලබා දීම | 22,450,677 | |
| SME ක්ෂේත්‍රය සඳහා RE විසඳුම් ලබා දීම | 1,282,438 | |
| සමඟ සහයෝගීත්වයෙන් ජාල මානන විසඳුම් ලබා දීම | 447,380 | |
| පවතින තාක්ෂණික ක්‍රමවේද ඇගයීම සහ RE විසඳුම් හඳුන්වා දීම | 1,539,438 | |
| ප්‍රාදේශීය ජීව වායු වැඩසටහන් | 6,290,312 | |
| බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික) ක්ෂේත්‍ර විශේෂිත | 159,832 | |
| විදුලිබල ක්ෂේත්‍ර සහාය ව්‍යාපෘතිය | 28,385 | |
| පිරිසිදු බලශක්ති ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 315,616 | |
| ක්වොන්ටම් ලීප් වැඩසටහන - සුළං බලශක්ති ඇගයීමේ ව්‍යාපෘතිය | 23,407 | |
| UNDP | 1,046,043 | |
| හම්බන්තොට RE වැඩහූමියෙහි මෙහෙයුම් කටයුතු | 12,261,613 | |
| ඉඳුරාන RE වැඩහූමියෙහි මෙහෙයුම් කටයුතු | 1,863,758 | |
| සුනිත්‍ය ජෛව ස්කන්ධ බලශක්ති ප්‍රවර්ධනය කිරීම | 59,600.00 | |
| | 61,214,014 | 15,893,866 |

| | | |
|---|---|---|
| **බලශක්ති කළමනාකරණය** | | |
| තොග බලශක්ති පරිභෝජන ආයතනවල ක්‍රමානුකූල බලශක්ති ප්‍රවේශයන් සඳහා ක්‍රියා පිළිවෙළ | | |
| බලශක්ති නාමකරණ වැඩසටහන | | |
| විද්‍යාගාර පහසුකම් ස්ථාපිත කිරීම (ADB සහාය තුළින්) | | |
| UDA ගොඩනැගිලි අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියට, විමර්ශන අත්පොත් තුළට සංග්‍රහය අන්තර්ගත කිරීම සහ සංග්‍රහය සමාලෝචනය කිරීම | | |
| මෝටර් පරීක්ෂා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම | | |
| අංශ විශේෂිත වැඩසටහන් | | |
| මිනුම් ලකුණු පිහිටුවීම | | |
| ත්‍රි උත්පාදක තාප ගබඩාකරණය පිළිබඳ අධ්‍යයන සහ උපකරණ පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීම | | |
| E2 වෙළඳසැලක් ස්ථාපිත කිරීම | | |
| E2 කලාපයක් ස්ථාපිත කිරීම | | |
| සුළං උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | | |
| ආලෝකකරණය සඳහා කලාපීය මධ්‍යස්ථානය | | |
| බලශක්ති කළමනාකරණ ඒකක පිහිටුවීම | 7,303,385 | 1,599,685 |
| සම්මත සහ නියාමන හඳුන්වාදීම | 3,696,855 | 2,399,567 |
| උපදේශාත්මක සහ උපදේශන සේවාවන් සැපයීම | 2,080,604 | 442,164 |
| ජයග්‍රහණ සඳහා සම්මාන ප්‍රදානය | 1,392,573 | 983,021 |
| ISO 5001 ප්‍රවර්ධනය කිරීම | 463,683 | 67,000 |
| පර්යේෂණ සහ සංවර්ධන සිදු කිරීම | 3,036,384 | 1,392,418 |
| අනාගත ප්‍රතිගුණනය සඳහා නියමු ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම | 72,926 | 10,575 |
| වෙළඳපොළ පදනම් කරගත් උපකරණ හඳුන්වා දීම | 1,200 | - |
| ආරක්ෂිත අරමුදල් | | - |
| | 18,047,610 | 6,894,429 |

| | 31.12.2014<br>Rs | 31.12.2013.<br>Rs |
|---|---|---|
| **දැනුම් කළමනාකරණය** | | |
| විදුල්කා බලශක්ති ප්‍රදර්ශනය | 4,740 | 6,096,665 |
| බලශක්ති සම්මන්ත්‍රණය | 125,000 | 150,987 |
| ශ්‍රී ලංකා බලශක්ති කාර්යක්ෂමතා සම්මාන | | 4,000,000 |
| සිද්ධි සන්නාමකරණය | 150,000 | 5,227,809 |
| ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය තුලින් දැනුවත්කිරීම් | 44,300 | 1,186,055 |
| පැසල් ළමුන් සඳහා අධ්‍යාපනය සහ දැනුවත්භාවය | | 1,663,694 |
| රාජ්‍ය සහ සංස්ථාපිත අංශ සඳහා අධ්‍යාපනය සහ දැනුවත් කිරීම | 661,920 | 335,809 |
| මහජනතාව සඳහා අධ්‍යාපනය සහ දැනුවත්භාවය | | 2,542,808 |
| අධ්‍යාපනික සහ ප්‍රවර්ධන මෙවලම් සංවර්ධනය | | 989,267 |
| ජීව වායු උත්පාදනය | | 286,691 |
| වෙනත් වැඩසටහන් | | 690 |
| සන්නිවේදන වැඩසටහන් | 162,626 | |
| | 1,148,586 | 22,480,475 |
| **ආර්ථික කටයුතු** | | |
| බලශක්ති ප්‍රතිපත්ති මැදිහත්වීම් | 1,519,346 | |
| බලශක්ති සැලසුම් සහ බලපෑම් ඇගයීම | 61,855 | |
| බලශක්ති කාර්යක්ෂමතා කලාප පිහිටුවීම | 2,217,025 | |
| පාසල් බලශක්ති සමාජ වැඩසටහන | 4,211,392 | |
| මාධ්‍ය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන | 4,896,729 | |
| විදුල්කා 2014 | 6,182,760 | |
| ව්‍යාපෘති වියදම් ADB ප්‍රදාන | 4,404,284 | |
| ව්‍යාපෘති වියදම් - වතු ක්ෂුද්‍ර ජලවිදුලි පුනරුත්ථාපන | 786,109 | |
| බලශක්ති දත්ත සහ තොරතුරු සම්පාදනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම | 63,672 | |
| බලශක්ති ප්‍රතිපත්ති පර්යේෂණ වැඩමුළුව | 168,000 | |
| | 24,511,172 | - |
| | **104,921,382** | **45,268,770** |
| **පුනරාවර්තන වියදම්** | | |
| **සටහන 17: වැටුප් සහ දීමනා** | | |
| කාර්ය මණ්ඩලය සඳහා වැටුප් | 40,090,983 | 29,666,211 |
| ජීවන වියදම් දීමනාව | 8,682,144 | 7,183,345 |
| කාර්ය මණ්ඩලය සඳහා දීමනා | | 4,410,459 |
| E.P.F. 12% | 5,329,702 | 4,631,189 |
| E.T.F. 3 % | 1,346,171 | 1,192,542 |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 3,852,306 | 3,188,743 |
| PAYE බදු | | |
| පාරිතෝෂික | 948,602 | 1,062,527 |
| වන්දි ගෙවීම් | | |
| ලබා නොගත් නිවාඩු | | 1,038,886 |
| වෛද්‍ය රක්ෂණය | 1,500,008 | |
| | **61,749,916** | **52,373,903** |

| | 31.12.2014. | 31.12.2013. |
|---|---|---|
| | Rs | Rs |
| **සටහන 18: ගමන් වියදම් සහ යැපීම්** | | |
| ගමන් වියදම් - දේශීය | 763,931 | 765,651 |
| ගමන් වියදම් -විදේශ | 559,139 | 1,451,286 |
| | **1,323,070** | **2,216,937** |
| **සටහන 19: සැපයුම්** | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 3,578,925 | 2,483,958 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 5,972,476 | 5,197,124 |
| වෙනත්-පුවත්පත් සහ විවිධ සේවා | 135,973 | 123,827 |
| | **9,687,374** | **7,804,909** |
| **සටහන 20: නඩත්තු වියදම්** | | |
| වාහන නඩත්තු සහ රක්ෂණ සහ බලපත්‍ර ගාස්තු | 7,420,108 | 5,879,835 |
| කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම | 595,203 | 574,478 |
| | **8,015,311** | **6,454,313** |
| **සටහන 21: කොන්ත්‍රාත් සේවා** | | |
| කාර්යාල කුලී සහ බදු ගාස්තු | 23,089,238 | 19,896,097 |
| තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු | 2,479,476 | 2,402,832 |
| ප්‍රවාහන | 825,802 | 218,901 |
| විගණන ගාස්තු | 600,000 | 600,000 |
| | **26,994,516** | **23,117,830** |
| **සටහන 22: ක්‍රමක්ෂය වියදම්** | | |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 1,978,455 | 1,395,683 |
| මෝටර් වාහන | 524,235 | 5,741,771 |
| ඡායා පිටපත් යන්ත්‍රය | 459,480 | 419,408 |
| පරිගණක | 4,124,389 | 3,784,272 |
| විදුලි භාණ්ඩ | 36,531 | 7,073 |
| පුස්තකාල පොත් | 9,801 | 24,953 |
| බලශක්ති උපකරණ | 4,731,111 | 11,379,385 |
| සුළං කුළුණු සහ උපකරණ | 9,606,811 | 7,781,052 |
| ශීතකරණ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය | 7,855,460 | |
| හම්බන්තොට බලශක්ති උද්‍යානය | 137,449,977 | 138,065,434 |
| ප්‍රදර්ශන උපකරණ | 500 | 7,500 |
| | **166,776,750** | **168,606,531** |
| **සටහන 23: වෙනත් පුනරාවර්තන වියදම්** | | |
| කාර්යාලීය සහ වෙනත් විවිධ වියදම් | 1,158,584 | 988,577 |
| පරිවර්තන ගාස්තු | 61,061 | 46,486 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ දීමනා | 700,000 | 452,000 |
| ආහාරපාන ගාස්තු | 1,045,782 | 886,708 |
| කම්කරු ගාස්තු | | |
| සුභසාධන වියදම් | | |
| දේශීය පුහුණු වැඩසටහන | 911,812 | 514,702 |
| බැංකු ගාස්තු | 84,095 | 2,307 |
| විදුල්කා සහ මහජන දැනුවත් කිරීම් | | 469,237 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) | 1,666,937 | 309,356 |
| අගය එකතු කිරීමේ බදු (VAT) | - | |
| | **5,628,271** | **3,669,374** |

**සටහන 24**

**පෙර වර්ෂ නැවත ප්‍රකාශයට පත් කිරීම**

| | 2013<br>රු<br>(හර)/බැර | |
|---|---|---|
| 1 විලම්භිත ප්‍රදාන | 230,001 | බැර |
| සමුච්චිත ක්‍රමක්ෂය | (230,001) | හර |
| 2 ණයගැතියන් | 91,679 | බැර |
| ආදායම | (91,679) | හර |
| 3 ඇපවීමේ අරමුදල | 3,025,951 | බැර |
| ශුද්ධ අතිරික්තය | (3,025,951) | හර |
| 4 ආදායම-බලපත්‍ර ගාස්තු | 4,714,220 | බැර |
| බලශක්ති අරමුදල | (4,714,220) | හර |
| 5 ආදායම- EF ප්‍රතිපූරණය කිරීම | 3,907,347 | බැර |
| බලශක්ති අරමුදල | (3,907,347) | හර |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/අයි/එස්එල්එස්ඊඒ/එෆ්ඒ/2014

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 දෙසැම්බර් 23 දින

සභාපති,

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති - 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම :** සුළං මැනීමේ කාර්යයන් සඳහා දත්ත සහ තොරතුරු එකතු කිරීම මත දරන ලද රු.796,800 ක්වූ වියදම ප්‍රමිතියේ 07 වගන්තිය ප්‍රකාරව ආයතනයේ කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් සඳහා ප්‍රවේශයක් නොවූවද, ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හම්බන්තොට සෝලර් පාක් ව්‍යාපෘතිය සඳහා මහවැලි අධිකාරියෙන් අත්කර ගත් අක්කර 50 ක භූමිභාගයක් සහිත ඉඩම සමාලෝචිත වර්ෂයේදී ද අගය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන්ම විනාශ වූ සුළං කුලුණ ස්ථාවර වත්කම් වලින් ඉවත් කර නොතිබූ අතර, එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම රු.2,377,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ බලශක්ති අරමුදලේ ආයෝජනයෙන් ආපසු ලබාගන්නා ලද මුදලින් දරන ලද තථ්‍ය වියදම රු.18,157,558 ක් විය. කෙසේ වුවද බලශක්ති අරමුදලෙන් බලශක්ති ආරක්ෂණ අරමුදලට (Energy Guarantee Fund) මාරු කරන ලද අනුරූපී මුදල රු.20,435,260 ක් විය. එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බලශක්ති සහතික අරමුදලේ සහ බලශක්ති අරමුදලේ ශේෂය පිළිවෙලින් රු.2,277,705 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී නිම කරන ලද රු.4,332,591 ක පිරිවැයකට ඉදිකර අධිකාරියට භාරදෙන ලද ජලාපවහන පද්ධතිය හා ආරක්ෂක කූඩාරම 2014 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එබැවින් එම වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.433,260 ක් වූ ක්ෂය සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඉ) "සුළං කුළුණ හා උපකරණ" වලට අදාළව රු.750,375 ක් වූ රඳවා ගැනීම් මුදල් ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ අඩුවෙන් දක්වා තිබූ අතර එම මුදලින් රඳවා ගැනීම් මුදල් ගිණුම්වලින් අත්හැරී තිබුණි. තවද එම වත්කම් සඳහා අදාළ ක්ෂය කොටස ගැලපීම් නොකිරීම හේතුවෙන් අධිකාරියේ හිමිකම් රු.643,836 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට "ආලෝකය සපයන උපකරණ සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ " (Regional Centre for Lighting) ගෙවිය යුතු කාර්යාල කුලී ශේෂයන් හා ඒ සඳහා දඩ මුදල් පිළිවෙලින් රු.8,697,719 ක් හා රු.81,620,195 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් හා අතිරික්තය පිළිවෙලින් එම මුදලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

මෙ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපතිවරයා විසින් පහත පරිදි දක්වා තිබුණි. "විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද උපදෙස් ප්‍රකාරව ඉහත සඳහන් රු.8,697,719 ඇතුළත් සියලු වගකීම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිරවුල් කළ යුතුය."

### 2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පිළිවෙලින් එකතුව රු.31,809,744 ක් සහ රු.48,044,402 ක්වූ ලැබිය යුතු මුදල් සහ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි. තවද එකී ශේෂයන් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් කැඳවා නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් ගේ නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය විගණනයේ දී තහවුරු කළ නොහැකි විය.

### 2.3 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

විගණනයේදි නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 8(1) වගන්තිය | 2013 සැප්තැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අධිකාරියේ 2014 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2014 පෙබරවාරි 11 දින දීය. |
| (ii) 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ 2014 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 (2)( ආ) | එක් අවස්ථාවකට රු.20,000 යන උප අග්‍රිම සීමාව ඉක්මවා අවස්ථා 15 කදී උප අග්‍රිම ලබා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) | අවස්ථා 19 කදී ලබා දෙන ලද එකතුව රු.320,334 ක් වූ උප අග්‍රිම ඒවා ලබාදෙන ලද කාර්යය සම්පූර්ණ කළ වහාම නිරවුල් කර නොතිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක, දෘඩාංග හා මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.11,538,586 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.41,566,908 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.30,028,322 ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති වියදම රු.59,652,612 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණනයේදී පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

### (අ) ප්‍රොටොටයිප් විදුලි වාහන 3 ක් **(Prototype Electric Vehicles)** සංවර්ධනය කිරීම

2007 සැප්තැම්බර් 28 සිට මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2009 වර්ෂය තුළදී රු. 7,888,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2015 මැයි 31 විගණන පරීක්ෂණ දිනය දක්වා එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධකට නොහැකි වී තිබුණි.

### (ආ) සුළං මනින කුඹ 10 ක් **(Wind Measuring Masts)**සැපයීම, පිරි සැකසීම ,සවිකිරීම හා පැවරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම පහසුකම ප්‍රසම්පාදනය සඳහා අධිකාරිය විසින් රු.23,770,000 ක මුදලක් දරා තිබුණි. කෙසේ වුවද සුළං මනින දත්ත රැස් කිරීම පිළිබඳව භෞතික කාර්ය සාධනය සියයට 51 ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එබැවින් සුළං මනින කුඹ ස්ථාපිත කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, සුළං මැනීමේ දත්ත රැස් කිරීම හා එම දත්ත වාර්තාකරණය ආදී අපේක්ෂිත අරමුණු සුළං මනින කුඹ ස්ථාපිත කිරීම මඟින් ඉටුකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(ii) නාඩුකුඩා හි සවි කරන ලද කුළුණ අවශ්‍ය ප්‍රමිතියට නොමැති වීම නිසා දරන ලද රු.1,827,125 ක පිරිවැය නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

(iii) කබරගල කුළුණ සවිකිරීම සඳහා වැඩපූර්ව අත්තිකාරම්, උපකරණ පිරිවැය හා වැඩබිම් පරීක්ෂණ ගාස්තු ලෙස 2011 වර්ෂයේදී රු.2,377,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2015 මැයි 31 දින වන විටත් කිසිදු ඉදිකිරීම කාර්යයක් සිදු කර නොතිබුණි.

(iv) පහත සඳහන් සුළං මනින කුඹ අලුත්වැඩියා කිරීමට හා නඩත්තු කිරීමට අධිකාරිය විසින් කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එබැවින් එම ස්ථාන වලින් දත්ත රැස්කිරීම එම එක් එක් ස්ථානයේ නම ඉදිරියෙන් දක්වා ඇති වර්ෂයේ සිට නවතා තිබුණි.

| මනින ස්ථානය | අවසානයට දත්ත රැස්කළ වර්ෂය |
|---|---|
| සිලාවතුර | 2012 |
| නානට්ටාන් | 2012 |
| යාල | 2011 |
| සාම්පූර් | 2009 |

(ඇ) **"ස්විච් -ඒෂියා"වැඩ සටහන (switch –Asia programme)**

"ස්විච් -ඒෂියා"වැඩ සටහන යටතේ ලැබුණු රු.7,334,354 ක මුදලින් රු.3,135,202 ක මුදලක්, 1994 ජූනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂ තුලදී අධිකාරියේ සියළු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.

මෙම ගෙවීම සියලුම නිලධාරීන්ගෙන් හෝ අධිකාරියේ සභාපතිගෙන් අයකර ගැනීමට , විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ එවකට ලේකම් විසින් ඔහුගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක පීඊ/අයිඒ/22/vol-II දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වුවද මෙම බලය නොලත් ගෙවීම් අයකර ගැනීම සඳහා විගණන පරීක්ෂණ දිනය වන 2015 මැයි 26 දක්වාත් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.3 හඳුනාගන්නා ලද පාඩු

එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් අධිකාරියේ සුනිත්‍ය සහතික අරමුදලෙන් 2012 දෙසැම්බර් 17 දින රු.8,000,000 මුදලක් තාවකාලිකව ණයට ගෙන එය වර්ෂ දෙකකට පසුව 2014 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. මෙම ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස විගණනය විසින් ඇස්තමේන්තු කරන ලද ආවස්ථික පිරිවැය රු.1,398,528 ක් විය.

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ හා ශ්‍රී ලංකා සුනිත්‍ය සහතික අරමුදලේ ආයෝජනයන්ගෙන් 2008 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ ලැබී තිබුණු රු.39,618,010 ක් වූ පොලී ආදායම අදාළ අරමුදල්වලට ප්‍රේෂණය කිරීමෙන් තොරව අධිකාරිය විසින් උපයෝජනය කර තිබුණි.

## 4. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) ගෙවීම් පරිපාටිය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு சக்தி அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත අධිකාරියකි
மின்வலு மற்றும் மீள்புத்தாக்க சக்தி அமைச்சின் நியதிச்சட்ட அதிகாரசபை
A Statutory Authority of Ministry of Power & Renewable Energy

මගේ අංකය: SEA/IA/CH/14/02
2015 ජූලි 30

ආර්.එම්.ජේ. රත්නායක මහතා
සහකාර විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණය පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව</u>

යොමු අංකය: EH/I/SLSEA/FA/2014

මෙය ඉහත සඳහන් වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධවයි. එම කරුණුවලට අදාල පිළිතුරු මේ සමඟ අමුණා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පිටපත්:

01. එස්.එම්.ජේ. ප්‍රියන්ත මහතා, විගණක අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව
02. ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
03. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 05 ගොඩනැගිල්ල, පළමු මහල, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
5ஆம் கட்டிடம், முதலாம் மாடி, BMICH, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07, இலங்கை.
Block 5-1st Floor, BMICH, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka.

| කාර්යාලය / அலுவலகம் / Office | දුරලිපිවනය / தொலைநகல் / Facsimile | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail | වෙබ් අඩවිය / இணையம் / Web Site |
|---|---|---|---|
| +94(0)11 267 7445 | +94(0)11 268 2534 | info@energy.gov.lk | www.energy.gov.lk |

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය සේවා සේවයේ ගිණුම් පිරිවිතර

සුලං මාපක දත්ත, තොරතුරු හා ඒවායේ තත්වය යනාදිය පිළිබඳ විස්තර බලශක්ති ප්‍රවර්ධනයේ දී හා වැඩි දියුණු කරන්නන්හට බලපත්‍ර නිකුත් කිරීමේ දී වැදගත්වේ. එබැවින් මෙම ආයෝජනය මගින් ආදායම් ඉපයීමට තුඩු දෙන්නක් වන හෙයින් ස්ථාවර වත්කම් යටතේ සිදු කර ඇතැයි දක්වන ප්‍රාග්ධන පිරිවැය අතිප්‍රකාශයක් නොවේ.

### 2.2.2 ගිණුම් අඩුපාඩු

(අ) කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අත්පත් කර ගැනීමේ ක්‍රියාදාමයක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පියවර ගෙන ඇති අතර, මහවැලි අධිකාරියෙන් මේවන විට ඔප්පුව අපේක්ෂිතව සිටි. අද වන විට එම ඔප්පුව ලියාපදිංචි කිරීම සඳහා මහවැලි අධිකාරියේ ඇඹිලිපිටිය ශාඛාව වෙත යවා ඇත. ඔප්පුව ලැබුණ වහා තක්සේරුව ලබා ගැනීමටත් එහි තථ්‍ය වටිනාකම වත්කම් ලේඛණයේ සඳහන් කිරීමට කටයුතු කෙරෙනු ඇත. මෙම කරුණ අධෝ ලිපියක් ලෙස 2013/2014 ශේෂ පත්‍රයේ පහලින් සඳහන් කර ඇති අතර, තක්සේරුවේ සැබෑ වටිනාකම ලැබුනු පසුව සැබෑ වටිනාකම ගිණුම්ගත කෙරෙනු ඇත. මෙකී තත්වය මාගේ 2013 පිළිතුරේ ද සඳහන් කර ඇත.

(ආ) 2015 ජුනි 05 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව ලබා දුන් උපදෙස් වලට අනුව, මූල්‍ය රෙගුලාසි 104 අයදුම්පත හා ප්‍රතිවිමර්ශණය කළ වාර්තාව අදාළ ලේඛණ සමඟ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එමගින් මෙම පාඩුව පිළිබඳව සඳහන් කර ඇති අතර, මූ.රෙ. 109 අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ලියා හැරීමට පියවර ගනු ලැබේ.

(ඇ) බලශක්ති අරමුදලින් වියදම් කර ඇති රු. 20,435,260/- ක මුදල නිවැරදිය. 2014 අයවැය ලෙජරයෙන් අදාළ අංශය මගින් ලබා ගෙන ඇති මෙම සංඛ්‍යාවන් සභාපතිවරයා විසින් අනුමත කර ඇත. සංඛ්‍යාමය විස්තර හා ලබා දී ඇති අනුමැතිය "අ" ඇමුණුමෙහි දක්වා ඇත. තවද, මෙය අධිකාරියේ අරමුදලට ලැබිය යුතු මුදලක් ලෙස 2014 ගිණුම්වල ගිණුම්ගත කර ඇත. අරමුදල් මාරු කිරීම 2015 වසරේ දී සිදු කර ඇත.

(ඈ) මෙම අත්වැරැද්ද අවසන් ගිණුම් තුල රු. 1,146,043/- ක් ලෙස නිවැරදි කර ඇත. සැපයුම්කරුවෙකුට ගෙවන ලද රු. 100,000/- ක අත්තිකාරම් මුදල මෙම මුදලට ඇතුළත්වේ.

(ඉ) උපචිත වියදම් ලෙස දක්වා ඇති රු. 7,531,110/- ක් වූ ලැයිස්තුවෙන් රු. 4,619,540.94 ක් පමණක් උපචිත වියදම් ලෙස 2014 අවසන් ගිණුම්වල දක්වා ඇත. ඉතිරි මුදල පහත පරිදි වේ.

| වවුචර් අංකය | කරුණු දැක්වීම් |
|---|---|
| 84 | රු. 1662851.60 මුදලක් ගෙවීමට ඇති ලෙස දක්වා ඇත. |
| 64 | රු. 1096987/- ලැබීමට නියමිත වැට් ලෙස දක්වා ඇත. |
| 177 | රු. 83270.88 – 2015 ජනවාරි මස අතිකාල ගෙවීම් |
| 82/130/158/218/222/312/313/314 | රු. 33601.72 - මෙය ආදාන වැට් වන අතර වියදමක් නොවේ. |

(ඊ) ආර්.සී.එල් වෙත ගෙවිය යුතු කාර්යාල කුලි මුදල රු. 90,317,915/- ක් නොව රු. 8,697,719/- ක් පමණි. දුවශීලී හානි සඳහා වන්දි ගෙවීමට අදාළව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කිසිදු ගිවිසුමක්

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සමඟ අත්සන් කර නොමැත. සියළු වත්කම් බැරකම් හා සේවකයන් ඇතුළු ආර්.සී.එල් 2012 වසර අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව වෙත භාර දී ඇත. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විසින් නිකුත් කර ඇති අමුණා ඇති ලිපි වලට අනුව උක්ත සඳහන් රු. 8,697,719/- ඇතුළු සියළු බැරකම් ලංකා විදුලිබල මණ්ඩලය වෙත පියවිය යුතුය. (ආ ඇමුණුම බලන්න).

(උ) මෙම මුදල් පොත් ශේෂය අවසන් ගිණුම්වල නිවැරදි කර ඇත.

(ඌ) මෙම සාවද්‍ය පරිසණකගත කිරීම් නිවැරදි කර ඇත.

(එ) මෙය නිවැරදි කර ඇති වුවද, හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය අදාළ අංශය මගින් ඉටු කර ඇති බවට WIP විසින් ලිඛිතව සනාථ කර නොමැත. එබැවින්, එය සාර්ථකව ඉටු කර ඇති බවට කිසිදු වගකීමක් නොමැත. එම හේතුව නිසා මෙම රු. 4,322,591/- ක් වූ මුදල තවමත් WIP හි ගිණුම්ගතව ඇත.

(ඒ) සුලං කුළුණු ඉදිකිරීම 2010 වසරට පෙර ආරම්භ කළ ද රඳවුම් මුදල් තවම ගෙවීමට ඇත. මෙය තහවුරු කර නොගෙන අනුමැතියක් අපට ලබා දීමට අපට හැකියාවක් නැත.

**2.2.3 නොසැසඳුනු විචල්‍යතා**

i) ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර ඇති මුදල් තුල වැට් බදු ද අඩංගු වේ. එසේ වුවද, ලෙජරයේ සඳහන් මුදල ආදායන වැට් (මෙය පසුකාලීනව ගිණුම්ගත කර ඇත) ඇතුළත් නොවේ. තවද, ස්ථාවර වත්කම් පුනරුත්ථාපන වියදම් ද ප්‍රකාශන වල ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇත. මෙම පුනරුත්ථාපනයන් නව අයිතමයන්ට අදාළව සිදු වී නොමැති නිසාත් ඒවා සියල්ල ස්ථාවර වත්කම් ලේඛණයේ නොදැක්වීම නිසා මෙම විෂමතාවය හට ගෙන ඇත.

ii) ගොඩනැගිලි ගිණුම යටතේ ඇති රු. 105,624/- ක මුදල ගොඩනැගිලි පුනරුත්ථාපනය යටතේ පොදු ලෙජරයේ සඳහන් කර ඇත. අනෙක් ඒවා නිවැරදි කර ඇති අතර. ක්‍රියාදාමයේදී හඳුනා ගන්නා ලද අනෙකුත් වැරදි/ ප්‍රමාද දෝෂයන් නිවැරදි කර ඇත.

iii) භාණ්ඩාගාර ලේඛන වලට අනුව, ගිණුම් වාර්තාවේ දක්වා ඇති පුනරාවර්ථන ප්‍රදාන මුදල රු. 81,998,000/- ක් නොව රු. 81,999,500/- කි. ඒ අනුව, ප්‍රදාන දෙක අතර වෙනස රු. 3,480,000/- ක් වන අතර මෙය අවසන් ගිණුම් තුල නිවැරදි කර ඇත (ඇ ඇමුණුම බලන්න).

iv) වැට් වාර්තාව අනුව, 2014/12/31 දිනට ගෙවිය යුතුව ඇති වැට් බද්ද රු. 1,096,987/- කි ("ඇ" ඇමුණුම බලන්න). මෙම මුදල 2014 දෙසැම්බර් මසට අදාළ වන අතර එය 2015 ජනවාරි මසදී ගෙවා ඇත. ඒ අනුව වැට් වාර්තාව හා පොදු ලෙජරය අතර වෙනස රු. 1,941,103/- කි. මෙය අවසන් ගිණුම් තුල පහත පරිදි නිවැරදි කර ඇත. අදාළ වසර තුල ගෙවූ වැට් බද්ද රු. 1,833,058/- (එන්.බී.ටී යටතේ දල කෙටුම්පතේ 23 වන සටහනෙහි ඇතුළත්) වන අතර නිවැරදිකළ මුළු වැට් මුදල රු. 10,286,572/- කි (ඉ ඇමුණුම බලන්න).

v) වගකීම් සහතික අරමුදලේ වෙනස අවසන් ගිණුම් තුල නිවැරදි කර ඇත. අවසන් ගිනුමේ සඳහන් වෙනස වන රු. 2,249,611/- ක මුදල නිවැරදිය. මෙම වෙනස හට ගැනීමට හේතුව වසර අවසානයේ ලැබීමට නියමිත පොලි මුදල නිසාය. ප්‍රතිආයෝජන වලට අදාළව ලැබීමට නියමිත පොලිය වගකීම් අරමුදල් ගිණුමේ නිවැරදිව බැර කර ඇත. පොලිය ලැබූ පසුව පමණක් ආයෝජන හර කළ හැකි බැවින් මෙම වෙනස ඇති වී ඇත. ලැබීමට නියමිත පොලී ශේෂය ආදායමට බැර කර ඇත.

බලශක්ති අරමුදලේ හා 2 වන ඉතුරුම් ගිණුම් වල ආයෝජන වල වෙනස අවසන් ගිණුම් තුල නිවැරදි කර ඇත. ඉතුරුම් ගිණුමෙන් 2014 වසරේ සිදු කළ බලශක්ති අරමුදල් ක්‍රියාකාරකමක් සඳහා මාරු කළ හැකි රු. මිලියන 20.4 ක් වන පවත්නා වෙනස හට ගෙන ඇති වුවද අධිකාරියේ අරමුදල් වලින් ගෙවීම් කර ඇත්තේ 2015 වසරේ දීය (2.2.2 ඇ බලන්න). මෙම මුදල 12 වන සටහන යටතේ අධිකාරියේ අරමුදලට ගිණුම් වලින් ගෙවීමට ඇති නිවැරදිව ගිණුම්ගත කර ඇත.

**2.2.4 ලැබීමට හා ගෙවීමට ඇති මුදල්**

විගණකාධිපතිරයා වෙත ඉදිරිපත් කිරිම සඳහා 2014 වසරට අදාළව ලැබීමට හා ගෙවීමට ඇති ශේෂ පිළිබඳව කාල විමසුමක් සැකසීමට පියවර ගෙන ඇත.

**2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනනුකූලවීම්**

(අ) (i) අයවැය සීමාවන් භාණ්ඩාගාරයෙන් ලැබුනේ 2013 නොවැම්බර් මසට පසුවයි. එබැවින් සැකසීම හා අනුමැතිය ලබා ගැනීම ප්‍රමාදවීම සිදු වුවද 2014 වසරේ පැවති පළමු රැස්වීමේ දී කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඊට හිමි විය.

(ii) විගණකාධිපතිතුමාගේ නිරීක්ෂණය නිවැරදිය. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම මේ වන විට සිදු වෙමින් පවති.

(ආ) (i) ස්ථාවර වත්කම් ලේඛනය 2014 වසරේ සිට පවත්වා ගෙන එන අතර මේ වන විට නිවැරදිව සකසා ඇත. විගණන වාර්තාවේ 2.2.3 (i) හි දක්වා ඇති නිවැරදි කිරීම් ද සිදු කර අවසන් කර ඇත.

(ii) පරිසණක දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛණයක් 2014 වසරේ සිට පවත්වාගෙක ඒමට කටයුතු කර ඇත.

(ඇ) (i) රු. 20000/- ක උප අක්මුදල ඉක්මවායාම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කළ ක්‍රියාකාරකම් වල ස්වභාවය නිසා ඇතැම් අවස්ථාවල දි වැළැක්වීමට අපොහොසත් වි ඇත. වැඩසටහන් වලින් බොහොමයක් බාහිර ස්ථාන වල සිදු කරන අතර එවැන්නක් රු. 200,000/- ක් වැනි මුදලකින් කළ නොහැකි ඒවා වේ. එබැවින් අවශ්‍යතාවය මත ඇතැම් ව්‍යාපෘති සඳහා රු. 100,000/- සීමාව දක්වා මුදල් සභාපතිතුමා විසින් අනුමත කර ඇත.

(ii) අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇති ක්‍රියාකාරකම් ඉටු කිරීමෙන් අනුතුරුව ඉතිරිව ඇති උප අක්මුදල් නියමිත ලෙස ගෙවන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(iii)2.2.2 (අ) හි දක්වා ඇති අන්දමට, ලියා හැරිම සඳහා අනුමැතිය පතමින් අදාළ ලේඛණ අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. එකී සියළුම ලේඛණ "ඊ" ලෙස අමුණා ඇති පිළිතුරු සමඟ විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත.

**3. මූල්‍ය විමසුම**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ කෙරේ අවධානය යොමු කර ඇත. අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කෙරේ.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**හඳුනාගත් පාඩු**

සිදු වී ඇති මෙම පාඩුවට හේතුව පැහැදිලි නැත. තවද, පාඩුව ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදය අපැහැදිලිය. පාඩුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දෙයක් ලෙස සැළකිය නොහැක. ඊට හේතුව වටිනාකම අපට නිවැරදිව ගණනය කළ නොහැකි බැවින් එය අය කර ගතනොහැකිවීමයි.

**3.2.1 ප්‍රොටො වර්ගයේ වාහන තුනක් තැනීම**

නීතිපතිවරයාගේ උපදෙස් මත නීතිමය පියවර ගෙන ඇත. සමථමය විසඳුමක් නීතිපතිවරයා විසින් නිර්දේශ කරමින් අවශ්‍ය කරන ලේඛණ ප්‍රමාණයක් ලබා ගෙන ඇත. මේ පිළිබඳව නීතිපතිවරයා තම සි/154/14/එස්එල්එස්ඊඒ ලිපියෙන් 2014 ජූලි 30 වන දින දැනුවත් කර තිබේ.

### 3.2.2 සුළං මැණුම් කුළුනු 10 ක් සැපයීම, සැකසීම හා සවිකිරීම

(අ) "සුළං මැණුම් දත්ත රැස් කිරීමේ භෞතික කාර්යසාධනය සියයට 51 ක් පමණ වීම" යන මෙකී ප්‍රකාශය විගණක කාල සීමා (2009-2012) හතර දත්ත ප්‍රතිශත ගණනය කිරීම සළකා බලන කළ පමණක් සත්‍ය වේ. කෙසේ වුවද, තථ්‍ය කුළුණු සවිකිරීම හා ඉවත් කිරීම (එසේ නැතහොත් දත්ත රැස්කිරීම නැවැත්වීම) අතර කාලසීමාව ගණනය කිරීමේ දි පමණක් දත්ත ප්‍රතිශතය ඉතා විශාල ප්‍රමණයකින් වැඩිවේ. මෙයට හේතුව වයඹ, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුදමය තත්වය හා ඉඩම් ආරවුල් නිසා කුළුණු සවි කිරීමේ දී යම් යම් ප්‍රමාදයන් ඇති විමයි. තවද, සුළං මෙට් මාස්ට්ස් වල හා විශේෂයෙන්ම මුහුදු බඩ ප්‍රදේශවල ඇති අදාළ උපකරණ වල ක්‍රියාකාරි ආයු කාලය සිමාසහිත බව හා මදවීම නිසා ඇතැම් සුළං මාපක කුළුණු වසර 2 කට වැඩි කාලයක් පවත්වාගෙන යාමට නොහැකි විය.

කෙසේ වුවද, සුළං සම්පත් තක්සේරු කාර්යයන් සඳහා ප්‍රමාණවත් වන මෙකී සුළං මෙට් මාස්ට්ස් සඳහා සුළං දත්ත ප්‍රමාණවත් ලෙස රැස් කිරීමට අධිකාරියට හැකි වි ඇත.

(ආ) මන්නාරම දිස්ත්‍රික්කය සඳහා සුළං බල සංවර්ධන ප්‍රධාන සැළසුම් නම් ආසියානු සංවර්ධන බැංකු වැඩසටහන සඳහා නව මීටර් 80 සුළං වෙට් මාස්ට් ඉදිකිරීමට අදාළව පහසුකම් සැපයීම සඳහා නාඩුකුඩා හි ඉදිකර ඇති කුළුණ මාස නවයකට ආසන්න කාලයක් ක්‍රියාත්මකර ඉවත් කරනු ලැබිනි. මීටර් 50 සුළං මෙට් මාස්ට් හා අදාළ උපකරණ (සිටවුම් වයර් ද ඇතුළුව) පරික්ෂාව සඳහා විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරිමේ හැකියාව ඇත.

අධිකාරියේ සුළං මෙට් මාස්ට් ක්‍රියාත්මක වු මෙම වසරක කාලය තුල මෙම පරිශ්‍රය සුළං බල ව්‍යාපෘති සංවර්ධනය සඳහා කදිම ස්ථානයක් බවට හඳුනා ගෙන ඇත. එබැවින් මෙම සුළං මෙට් මාස්ට් විස්ථාපනය කර එම පරිශ්‍රය තුලම වඩාත් ඵලදායි සුළං මිනුම් කටයුතු සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ මීටර් 80 සුළං මෙට් මාස්ට් ඉදි කිරීමට භාවිතා කර ඇත.

මිටර් 80 සුළං මෙට් මාස්ට් දත්ත කලාපීය සුළං රටා හඳුනා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකු අධ්‍යයනය සඳහා භාවිතා කෙරේ. මන්නාරම දිස්ත්‍රික්කය හා අවට ඇති කළා සඳහා විස්තරාත්මක සුළං සම්පත් සිතියම මෙම වැඩසටහන යටතේ දැනටමත් සකසා ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස, කලාපයේ සමස්ත සුළං බල ව්‍යාපෘති සංවර්ධන ධාරිතාවය කිලෝ වෝට්ස් 375 ක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම ඇස්තමේන්තුගත මෙගා වෝට්ස් 100 සුළං උද්‍යාන සංකල්පයක් ලෙස ආරම්භයේදී ම වැඩි කළ හැකි බවට වාර්තාවේ. සුනිත්‍ය බල අධිකාරිය ආසියානු සංවර්ධන බැංකු වැඩසටහනේ ක්‍රියාධරයා ලෙස මෙම නව සුළං මෙට් මාස්ට් දත්ත හා සොයාගැනීම් වලට ප්‍රවේශවීමේ හැකියාව ඇත. මෙම දත්ත අනාගත සුළං බල ව්‍යාපෘති සංවර්ධන කටයුතු සඳහා භාවිතා කෙරේ.

ඇ) පහත සඳහන් මුදල් පමණක් කබරගල සුළං මාපකය තැනීම හා සවි කිරිම සඳහා "ඊ නෙට් සොලුෂන්" ආයතනය සමඟ අත්සන් තළ ටෙන්ඩර් අංක එස්ඊඒ/ආර්ඊ/ඩබ්ආර්/එන්ආර්එස්/ආර් 8000 යටතේ ශ්‍රි ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ගෙවා ඇත.

| අංකය | විස්තරය | මුදල (ලංකා රුපියල්) |
|---|---|---|
| 01 | විස්තර සැකසීම හා යෝජනාව පිළිබඳ අවසන් එකඟතාවය හා ගිවිසුම අත්සන් කිරිමට පිළිබඳ සාකච්ජාව (25% ක යෙදවුම් අත්තිකාරම) | 416,875.00 |
| 02 | කුළුණු තැනීම අවසන් කිරීම - එස්ඊඒ පිරික්සුම් ඉංජිනේරු නියෝජිත නිර්දේශය - 50% | 833,750.00 |

| | | |
|---|---|---|
| 03 | උපකරණ වල වටිනාකම් | 576,500.00 |
| | ඊ නෙට් වෙත එස්ඊ්ජ් විසින් ගෙවනලද මුළු මුදල | 1,827,125.00 |

මෙම සුලං මිනුම් කුළුන හා උපකරණ අධිකාරිය සතු දේපල වේ.

ඇ) කලමැටිය, සාම්පූර්, බලංගොඩ හා සීතාඑළියේ ඉදිකර ඇති සුලං මිනුම් මාස්ට්ස් හතරේ නඩත්තු කටයුතු අධිකාරිය විසින් 2014 වසර තුල සාර්ථකව සිදු කර ඇත. මෙම කුළුණුවල නඩත්තු කටයුතු සාර්ථකව නිම කල දා පටන් මෙම කුළුනු ක්‍රියාත්මක තත්වයේ (දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය) පවතී. ඊට අමතරව, සිලාවතුර සුලං මැණුම් මධ්‍යස්ථානය මහා පරිමාණ නඩත්තුවකට ලක් කර ඇති අතර, නුදුරු අනාගතයේදී ම ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත. (අ) හි වැඩිදුරටත් සාකච්ජා කළ පරිදි, දැඩි මලකඩ ඇතිකරවන වාතාවරණයක් ඇති (මුහුදුබඩ තීරුව) පිහිටි ඇතැම් සුලං මෙට් මාස්ට්ස් වල ආයු කාලය අවසන් වි ඇත. ඒ අනුව, යාල හා නන්නාදන් වල පිහිටි කුළුණු අක්‍රිය වී ඇත.

සුලං සම්පත් ඇගයුම් කටයුතු සඳහා ප්‍රමාණවත් වන මෙකී සුලං මෙට් මාස්ට් බොහොමයක් පිළිබඳ සුලං දත්ත ඒකරාශී කර ගැනීමට අධිකාරියට හැකි වී ඇත. මෙම දත්ත පදනම් තරගෙන කලාපීය සුලං සිතියම් සංග්‍රහය සැකසීම මේ වන විට අධිකාරිය කටයුතු කරමින් පවති. මන්නාරම සුලං සම්පත් සිතියම් සංග්‍රහය සහ සංවර්ධන සැළැස්ම දැනට සකසා නිම කර ඇත. පුත්තලම සම්පත් සිතියම් සංග්‍රහය හා උඩප්පුව හා මුල්ලිපුරම සුලං මැණුම් මාස්ට් දත්ත පදනම් කර ගත් සම්පත් ප්‍රශස්තිකරණ අධ්‍යයනයේ කටයුතු අධිකාරිය විසින් අවසන් අදියරට ගෙනවිත් ඇත.

මෙම දත්ත රටේ සුලං බලශක්ති ව්‍යාපෘති සැකසීම සඳහා වැඩි වශයෙන් යොදා ගැනේ. සුලං බලශක්ති ව්‍යාපෘති සංවර්ධන වැඩකටයුතු රාශියක් 2010 වසරේ සිට සිදු කෙරමින් පවතින අතර, එහිදී අද වන විට ස්ථාපිත කර ඇති සුලං බලශක්ති ධාරිතාවය මෙගා වෝට්ස් 125 කි. තම ව්‍යාපෘති දියත් කිරීමේ දී මෙකී සුලං මෙට් මාස්ට් සුලං ව්‍යාපෘති සිදු කරන්නන් හට ඉතා ප්‍රයෝජනවත් වේ.
එබැවින් ව්‍යාපෘතියට අදාළ ගෙවීම් දැනටමත් ගෙවා අවසන් කර ඇති බවට අධිකාරිය විශ්වාස කෙරේ.

### 3.2.3 ස්විච් - ඒෂියා වැඩසටහන

මේ සම්බන්ධව විගණකාධිපතිවරයා ලබා දී ඇති උපදෙස වන්නේ ලේකම්වරයා ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව කටයුතු කරන ලෙසත් කරුණ ලේකම් හා භාණ්ඩාගාරය සමඟ සාකච්ජා කර සාමකාමී විසඳුමකට එළැඹෙන ලෙසත්ය. ඒ අනුව, කරුණට අදාළ පියවර ගෙන ඇති අතර ඒ පිළිබඳ වැඩි විස්තර පහත දක්වා ඇත.
කරුණු නිරාකරණය කළ ආකාරය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා හට 2012.12.05 දාතම දරණ ලිපිය මගින් දැනුම් දුන් අතර, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය 2013 ජනවාරි 24 දාතම දරණ ලිපිය මගින් ඉල්ලා ඇත. අනතුරුව, ශ්‍රී ලංකා සුනිත්‍ය බල අධිකාරිය පරිසර හා පුනර්ජණනීය අමාත්‍යාංශයේ විෂය පථයට පත් විය. ඒ අනුව, භාණ්ඩාගාරයට යැවූ ලිපිය පරිසර හා පුනර්ජණනීය අමාත්‍යාංශය මගින් ද භාණ්ඩාගාරය වෙත නැවත යැවුනි. තවද පවත්නා සම්පූර්ණ තත්වය පිළිබඳව කෝප් කමිටුවේ ලේකම්වරයා වෙත 2014.12.02 දාතමැති ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට පිටපත් සහිතව දන්වා යැවිනි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

කාර්ය මණ්ඩල කළමනාකරණයේ පවතින සුළු පරිමාණ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය කරන පියවර ගෙන ඇති අතර, අංශයේ කටයුතු සාමාන්‍ය පරිදි සිදු කෙරේ.

### 3.4 මතභේදාත්මක ගණුදෙනු

ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලියෙන් කොටසක් වගකීම් අරමුදලේ තැන්පත් කෙරේ. ඉන් යම් ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් ලැබෙන අප්‍රමාණවත් අක් මුදල් වියදම් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආදායමට යොදා ගනී.

### 3.5 අවසර නොලද ගෙවීම්

2013/07/30 දිනැති එස්ඊජ් 23/2013 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සහ වැටුප් හා සේවක මණ්ඩල කොමිසමේ අනුමැතිය පතා ඉල්ලීම් ලිපියක් 2013.08.29 වන දින යවා ඇත. මෙම ගෙවීම සඳහා සභාපතිවරයා තම අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013.12.30 දාතම දරණ ඉල්ලීම් ලිපියට අනුව ලබා දී ඇත. ප්‍රධාන කොටම සේවකයන් දිරිමත් කිරීමේ අරමුණ ඇතිව මෙම ක්‍රමය හඳුන්වා දී ඇත.

### 3.6 නොගෙවූ විදේශ අත්තිකාරම්

විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දක්වා ඇති මෙම අත්තිකාරම් 2014 වසර තුල ගෙවා නිම කර ඇත.

## 4. වගකීම්සහගතබව හා යහපාලනය

### 4.1 අයවැයමය පාලනය

විගණකාධිපතිවරයා විසින් නිරීක්ෂණයට ලක් කර ඇති වෙනස්කම් ගලපා ඇති අතර, අවසාන වශයෙන් සංශෝධනය කර ඇති ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ගැනිමෙන් පසුව ඉදිරිපත් කර ඇති අතර ඒවා විගණකාධිපතිවරයා වෙත ලබා දි ඇත.

## 5. පද්ධති හා පාලන

විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් නිරීක්ෂණය කර ඇති අඩුපාඩු කෙරේ දැඩි අවධානය යොමු කර ඇති අතර, ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත් නිරීක්ෂණයට ලක් කර ඇති තත්වයන් යථාවත් කිරීමට සැළසුම් කර ඇත.